# කතෝලික ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

## 11 ශ්‍රේණිය

**(2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)**


**ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**ජාතික අධ්‍යාපන ආයතනය**

**ශ්‍රී ලංකාව**

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපැල : info@nie.lk

# කතෝලික ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

## 11 ශ්‍රේණිය

(2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)


ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපැල : info@nie.lk

කතෝලික ධර්මය

11 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2016

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN: ......................

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

මුද්‍රණය :
මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2016 වර්ෂයේ දී හත්වන සහ එකොළොස්වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතාවන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයා හට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශය හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුවද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

## විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමැතිය** : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය සම්බන්ධීකරණය** :
- අධ්‍යාපනපති ගරු කාල්ටන් ද සිල්වා පියතුමා
  කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය
- ශාස්ත්‍රපති ගරු එස්. අන්‍ද්‍රයාස් ඒ. ප්‍රනාන්දු නි.ම.නි. පියතුමා
  සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය

**ලේඛක මණ්ඩලය**

- අධ්‍යාපනපති හා සාමාජීය විද්‍යාපති ගරු ජූඩ් දසනායක පියතුමා
  (කථිකාචාර්ය, බිංගිරිය විද්‍යාපීඨය)
- ශාස්ත්‍රපති එස්. ජී. කේ. ඩී. එල්. සී. ප්‍රසාද් මහතා
  (ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම)
- පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාධාරී දුෂ්මන්ති දයා කුමාරි ද සිල්වා මෙනෙවිය
  (ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, මීනුවන්ගොඩ)
- ඩී. අයි. ජෝසප් මෙනෙවිය
  (ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, කොළඹ)
- ශාස්ත්‍රපති ඈන් නිශාන්ති රත්නසිංහ මෙනෙවිය
  (ගුරු සේවය, සාන්ත ජෝසප් බාලිකා විදුහල, නුගේගොඩ)
- පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාධාරී ටී. අයි. රන්ගනායගම් මහතා
  (ගුරු සේවය, ශාන්ත අන්තෝනි බාලිකා විද්‍යාලය, කොළඹ 03)
- ශාස්ත්‍රවේදී ටී. ජේ. පෝල් ඇන්තනි මහත්මිය
  (විශ්‍රාමික විදුහල්පතිනිය)

**කතෝලික උපදේශක මණ්ඩලය**

- අතිඋතුම් මැක්ස්වෙල් සිල්වා රදගුරුතුමා
  සභාපති, අධ්‍යාපන, ධර්මෝපදේශ හා බයිබල් අධ්‍යයනය පිළිබඳ රදගුරු කොමිසම
- අතිඋතුම් ජෝශප් පොන්නයියා රදගුරුතුමා
  උපසභාපති, අධ්‍යාපන, ධර්මෝපදේශ හා බයිබල් අධ්‍යයනය පිළිබඳ රදගුරු කොමිසම
- අතිගරු අයිවන් පෙරේරා පියතුමා, කතෝලික පාසල් පිළිබඳ ජාතික අධ්‍යක්ෂ
- ගරු පියල් ජානක ප්‍රනාන්දු පියතුමා, බයිබල් හා ධර්මෝපදේශ පිළිබඳ ජාතික අධ්‍යක්ෂ
- ආචාර්ය ගරු හෙන්රි සිල්වා පියතුමා, කථිකාචාර්ය, ක්‍රිස්තියානි සංස්කෘතිය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
- ආචාර්ය ගරු ඥාණමුත්තු හෙක්ටර් පිලේන්ද්‍රන් පියතුමා, අංශ ප්‍රධාන, බටහිර සම්භාව්‍ය සංස්කෘතික හා ක්‍රිස්තියානි හා ඉස්ලාමීය සංස්කෘතික දෙපාර්තමේන්තුව, යාපනය විශ්වවිද්‍යාලය
- ගරු ග්‍රෙගරි එල්. ප්‍රනාන්දු පියතුමා, සහකාර අධ්‍යක්ෂ, ආගමික අංශය, අධ්‍යාපන අමාත්‍යාංශය

**පරිගණක වදන් සැකසුම**

මංගලිකා විජේරත්න මහත්මිය, කළමනාකරණ සහකාර 1, ජාතික අධ්‍යාපන ආයතනය

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

කතෝලික ධර්මයට අනුව සාර්ථක ජීවිතයක් ගත කිරීමට අත්‍යවශ්‍ය නිපුණතා පාදක කොට ගනිමින් පාසල් අධ්‍යාපනය හරහා එම නිපුණතා සංවර්ධනය කර ගැනීමට ඉඩ ප්‍රස්ථා සලසමින් මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කර ඇත.

දැනුමින් පමණක් හිස පුරවා ගෙන දැනුම් කේන්ද්‍රීය විභාග ක්‍රමයක් යටතේ ඉහළ සාමාර්ථ ලබා ගැනීම පමණක් නොසෑහේ. දැනුම පමණක් ලබා දෙන අධ්‍යාපන ක්‍රමයක් සාර්ථක අධ්‍යාපන ක්‍රමයක් ලෙස සැලකිය නොහැකි ය. අධ්‍යාපනය තුළින් ආවේදන නොවරදීම තීව්‍ර කර, කුසලතා අනිවාර්යයෙන් ම ඔපමට්ටම් කළ යුතු ය. මේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අදිටනින් මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කර ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශය විෂය නිර්දේශයට අනුරූප ව ලියා ඇති අතර පෙළපොත මෙම ගුරු මාර්ගෝපදේශයට හා විෂය නිර්දේශයට අනුව ලියවීමට නියමිත ය. එබැවින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී මෙම සීමාවන් නොඉක්මවා කටයුතු සංවිධානය කර ගැනීමට වගබලා ගත යුතු ය. එහි දී :

- පාඩමට ප්‍රවේශය වඩාත් වැදගත් බැවින් ප්‍රබෝධාත්මක ආරම්භයක් ලබා දෙමින් එය හොඳින් සිදු කරන්න.
- පාඩමට ප්‍රවේශවීමට හා පාඩම සංවර්ධනය සඳහා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් පරිශීලනය කරන්න.
- සුදුසු පරිදි කණ්ඩායම් කර කණ්ඩායම් ක්‍රියාකාරකම්වල සිසුන් යොදවන්න.
- ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී වඩාත් සුදුසු ස්ථානය තෝරා ගැනීමට උනන්දු වන්න.
- මෙහි දක්වා ඇති ඉගෙනුම් පලවලින් සිසුන්ගේ ජීවිත පොහොනි කරලීමට කටයුතු කරන්න.
- සිසුන්ගේ විශ්වාසය වර්ධනය කිරීමට කටයුතු කරන්න.

මෙහි ඇතුළත් පාඩම්වලට යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය භාවිත කිරීම අනිවාර්ය නොවන අතර විකල්ප ඉගෙනුම් ක්‍රම, සුදුසු පරිදි භාවිත කළ හැකි ය. එහෙත් නිපුණතාව, නිපුණතා මට්ටම, ඉගෙනුම් පල හා විෂය අන්තර්ගතයෙන් බැහැර නොවිය යුතු ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ක්‍රිස්තියානි ආගමික ආකල්ප වර්ධනය කෙරෙහි ද ප්‍රායෝගික අවස්ථා යොදා ගැනීම කෙරෙහි ද වැඩි අවධානයක් යොමු කරන්න.

පාඩම ආරම්භයේ සිට අවසානය දක්වා තක්සේරුව සිදු කළ යුතු අතර හැකියා නොහැකියා අනුව ප්‍රතිපෝෂණය හා ඉදිරිපෝෂණය ලබා දිය යුතු ය. බොහෝ විට කාල සටහන් සැකසීමේ දී එකවිට කාලච්ඡේද දෙකක් එකවර නොලැබෙන හෙයින් අදාළ පාඩම කළමනාකරණය කර ගැනීම ඔබ සතු වගකීමකි. අදාළ පාඩමට අපේක්ෂිත ඇගයීම, තක්සේරුව හා ඇගයීම් නිර්ණායක අනුව සකස් කර ගන්න. ඇගයීම් සිදු කිරීමේ දී ලකුණු ලබා දෙන නිර්ණායක පිළිබඳ පෙරාතුව සිසුන් දැනුවත් කරන්න. ඔබ විසින් සිසුන්ට ලබා දෙන ලද අභ්‍යාසවල නිරවද්‍යතාව පරීක්ෂා කොට සටහන් තබන්න.

සෑම පාඩම් සටහනක් අවසානයේ ම යොදා ඇති ගෙදර පරිසරයෙන් යන කොටස දෙමාපිය වැඩිහිටි සහභාගිත්වය යටතේ සිදුකිරීමට යෝජිත ය. ඒ සඳහා උපදෙස් විදුහල්පති මගින් ද, විෂය භාර ගුරුභවතා පංති කවවල දී ද දෙමාපියන්ට හා වැඩිහිටියන්ට ලබා දීමට කටයුතු කළ යුතු ය.

**කථිකාචාර්ය, ගරු කාල්ටන් ද සිල්වා පියතුමා**
**ව්‍යාපෘති නායක**

| පටුන | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | i |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | ii |
| විෂයමාලා කමිටුව | iii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | iv |
| විෂය නිර්දේශය | vi - xxv |
| ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1 - 66 |
| විවිධ සහාය | 67 |

# විෂය නිර්දේශය

## විෂය හැඳින්වීම

ආගම යනු ජීවිතය යි. එහෙයින් ජීවිතයෙන් ආගම වෙන් කළ නොහැකි ය. සෑම ආගමක ම පරමාර්ථය සදාචාරසම්පන්න ගුණගරුක සමාජයක් ගොඩනැගීම යි. එම අරමුණත් පෙරදැරි කර ගෙන නව විෂයමාලා ප්‍රතිසංස්කරණ හඳුන්වා දුන් අතර එහි මුඛ්‍ය පරමාර්ථය වන්නේ සිසුන් තුළ නිපුණතා ගොඩනැගීම යි. නිපුණතාවක් යනු දැනුම, ආකල්ප, කුසලතා හා අන්තර් පුද්ගල හැකියා ඒකරාශී කරගත් ජීවිත පුරුද්දකි. අධ්‍යාපන දාර්ශනිකයන් අන්තර් පුද්ගල හැකියා යනුවෙන් අර්ථ දක්වනුයේ වෙන කිසිවක් නොව කිතුනු අප "ප්‍රේමය" යනුවෙන් හඳුන්වනු ලබන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ මූලික ඉගැන්වීම යි. එබැවින් උත්තම ගුරු දේවයාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ හා ශුද්ධ වූ කතෝලික සභා ඉගැන්වීම් පිළිබඳ පූර්ණ අවබෝධයක් ලබා, කිතුනු ආකල්ප සංවර්ධනය කර ගෙන, කුසලතාවලින් පරිපූර්ණ වී, ප්‍රේමය මත ගොඩනැගුණු ජීවිත පුරුද්දක් ඇති කිරීම කතෝලික විෂයයෙහි මෙම නව සංස්කරණ මගින් ඉලක්ක කෙරේ.

කිතුනු ඉගැන්වීම්වල පදනම ශුද්ධ බයිබලය යි. මන්ද යත් කිතුනු විශ්වාසය, බලාපොරොත්තුව හා ප්‍රේමය ශුද්ධ බයිබලීය ඉගැන්වීම් මත පදනම් වී ඇත. එබැවින් මෙම කතෝලික විෂය නිර්දේශයෙහි පළමු තේමාව වන්නේ ශුද්ධ බයිබලය යි. තව ද ශු. දෙවන ජුවාම් පාවුලු මුනිතුමා විසින් නිර්දේශිත විශේෂ කමිටුවක් විසින් සම්පාදනය කරනු ලැබූ "කතෝලික සභා ධර්මෝපදේශය" (Catechism of the Catholic Church) නමැති ග්‍රන්ථයෙහි තේමාවන්ට අනුකූල ව ඉතිරි තේමා හතර ගොනුකර ඇත. ඒ අනුව මෙම විෂය නිර්දේශයේ පහත සඳහන් තේමා පහ ඇතුළත් කර ඇත.

1. ශුද්ධ බයිබලය
2. ත්‍රිත්වික දෙවියන් වහන්සේ
3. විශ්වාසයේ ජීවිතයට ශක්තිය
4. විශ්වාසයේ ජීවිතය ක්‍රියාත්මක කිරීම
5. යාච්ඤාවේ ජීවිතය

එම තේමා පහ අනුව නිපුණතා පහක් 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා විෂය නිර්දේශයෙන් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරේ.

කතෝලික විෂය නිර්දේශයේ දක්වා ඇති නිපුණතා සාක්ෂාත් කර ගනිමින් අනාගතයේ දී වැඩිහිටි කතෝලික නිපුණයෙකු ලෙස ක්‍රියාකාරී වීමට වර්තමාන දරුවා ගොඩනැගීම අවශ්‍ය වේ. ඒ සඳහා 6-9 ශ්‍රේණිවල දී මූලික ජීවිත පුරුද්දක් ඇති කර 10-11 ශ්‍රේණිවල දී පූර්ණ කතෝලික බැතිමතෙකු ලෙස තිබිය යුතු නිපුණතා ගොඩනැගීම මෙයින් අපේක්ෂා කෙරේ. මන්ද 12-13 ශ්‍රේණිවල කලා විෂය ධාරාවෙන් ක්‍රිස්තියානි ධර්මය හෝ ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය තෝරා ගන්නා අතළොස්සක් හැර ඉතිරි කතෝලික බහුතරයේ ආගමික දැනුම අ.පො.ස. (සා.පෙළ) විෂය නිර්දේශයට බොහෝවිට සීමා වන බැවිනි.

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ දක්වා ඇති ක්‍රියාකාරකම් තවදුරටත් සංවර්ධනය කරමින්, අදාළ නිපුණතා සිසුන් තුළ ගොඩනැගීමට ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රියාකාරකම් නිර්මාණය කිරීම, සම්පත් දායකයෙකු ලෙස කටයුතු කරන ගුරුවරයාගේ වගකීම යි.

ආගම විෂය උගන්වන ගුරුවරයා විශේෂයෙන් එම ධර්මතා පිළිඹිබු කරන කැඩපතක් විය යුතු ය. එහෙයින් පළමු ව ගුරුවරයා සදාචාර සම්පන්න ජීවිතයක් ගත කරන, ආගමික සංකල්ප තමන් තුළ ප්‍රගුණ කරගත් පුද්ගලයෙකු බව ශිෂ්‍යයාට අවබෝධ විය යුතු ය.

## ජාතික අධ්‍යාපන පද්ධතිය සඳහා අරමුණු

## ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතුය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

1. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පය මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම.
2. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.
3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත්වීම යන ගුණාංග වර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.
4. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.
5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.
6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.
7. සීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදුවන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථකව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.
8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමිකර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වු ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

## පොදු නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

1. **සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනු කාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදිව සහ නිරවුල්ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** භාණ්ඩ, අවකාශය සහ කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය** රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති හා වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද, සේවා පරිශ්‍රයන් තුළදී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

2. **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**
   - නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලි හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
   - සෘජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
   - චිත්තවේගී බුද්ධිය

3. **පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

**සමාජ පරිසරය** ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය** සජීවි ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය** අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත්වීම සඳහා මෙවලම් හා තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

**4. වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

ආර්ථික සංවර්ධනයට දායක වීම. තම වෘත්තීය ලැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම. හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

**5. ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

**6. ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

**7. ඉගෙනීමට ඉගෙනුම් පිළිබඳ නිපුණතා**

සීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදීව හා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණ.

## විෂයයේ අරමුණු

1. තම ජීවිතය ගොඩනගා ගැනීමට ශුද්ධ බයිබලය පිටිවහලක් කර ගනියි.

2. මැවිල්ලේ උතුම් ම මැවිල්ල වන මනුෂ්‍යයාගේ මැවුම්කරුවාණන්, දෙවියන් වහන්සේ බව හඳුනා ගනියි.

3. ක්‍රිස්තුන් වහන්සේගේ දූත කාර්ය හා උත්ථානයේ අත්දැකීම පිළිගෙන පරිණත කිතුනු ජීවිතයක් ගත කරයි.

4. දේව වාක්‍යය, දේව ප්‍රසාද නිධාන හා ජනවන්දනාව තුළින් පෝෂණය ලබා සමාජය තුළ සාක්ෂි දරයි.

5. ධර්මය ඉගෙනීම හා ජීවත්වීම එක ම ක්‍රියාවලියක් බව අවබෝධ කර ගනියි.

6. දේව පනත් හා කන්ද උඩ දේශනය තුළ ගැබ් ව ඇති කිතුනු සදාචාරමය ඉගැන්වීම් පදනම් කරගෙන ජීවත් වෙයි.

7. යාච්ඤාවේ බලයෙන් ශක්තිමත් වී දේව වරප්‍රසාද අත්දකියි.

8. ක්‍රිස්තුන් වහන්සේගේ අසීමිත ප්‍රේමය සමාජය තුළ පතුරුවාලීමට ක්‍රියා කරයි.

9. තමා අවට ස්වභාවික පරිසරය දෙවියන් වහන්සේගෙන් ලද තිළිණයක් බව පිළිගෙන එය සුරැකීමටත් සංවර්ධනය කිරීමටත් අවශ්‍ය හැකියාව හා දැනුම වර්ධනය කර ගනියි.

10. සාරධර්ම සුරකිමින් මානව සබඳතා ගොඩනගා ගෙන, කිතුනු අනන්‍යතාව තුළ සහජීවනයෙන් යුතු සමාජයක් බිහිකරලීමට දායක වෙයි.

11. කිතුනු විශ්වාසය රැක ගනිමින්, සෑම ආගමකට ම ගරු කිරීමට පුරුදු වෙයි.

12. ශ්‍රී ලාංකික පුරවැසියකු වශයෙන් තම රට කෙරෙහි ආදරයක් හා ගෞරවයක් ජනිත කර ගනියි.

## විෂය අදාළ නිපුණතා

1. ශුද්ධ බයිබලය පිළිබඳ ව අවබෝධය ලබා එදිනෙදා ජීවිතයේ දී ඵලදායී ව භාවිත කරයි.

2. දේව අනාවරණයට ප්‍රතිචාර දක්වමින් විශ්වාසයේ ජීවිතයක් ගත කරයි.

3. දේව ප්‍රසාද නිධාන මගින් ක්‍රිස්තුන් වහන්සේට සම්බන්ධ වී නව පීවිතයකට සාක්ෂි දරයි.

4. දේව පනත් පිළිපදිමින් ප්‍රේමයේ ජීවිතයක් ගත කරයි.

5. යාච්ඤාවෙන් පෝෂණය ලබා දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමඟ ගැඹුරු සම්බන්ධතාවක් ගොඩනගා ගනියි.

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

## 01 වන පාඩම
## නික්මයාම

**නිපුණතාව** 1.0 : ශුද්ධ බයිබලය පිළිබඳ අවබෝධය ලබා එදිනෙදා ජීවිතයේ දී ඵලදායී ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** 11.1.1 : දේව ධාර්මික සම්ප්‍රදයයන් පිළිබඳ අවබෝධය පංච පුස්තකය අධ්‍යයනය කිරීමේ දී භාවිත කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- පංච පුස්තකය පිළිබඳ කරුණු ගොනු කරයි.
- අදරැති දෙවි පියාණන් වහන්සේට ප්‍රතිප්‍රේමය දැක්විය යුතු බව පිළිගනියි.
- ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- දේව ධාර්මික සම්ප්‍රදයයන් පංච පුස්තකය අවබෝධ කරගැනීමට යොදා ගනියි.
- දේව ප්‍රේමය තුළ අන් අය සමග සහයෝගයෙන් කටයුතු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- පෙර පුහුණුවකින් යුතු ව ඇමුණුම 2හි ඇති දෙබස පංතිය තුළ ක්‍රියාත්මක කර, පහත සඳහන් කරුණු ඇසුරෙන් සාකච්ඡාවක් කරන්න.
    - පංච පුස්තකයට අයත් පොත් ගණන
    - එම පොත්වල නම්
    - පංච පුස්තකය හඳුන්වන වෙනත් නම්
    - පංච පුස්තකයේ අන්තර්ගතය
        - දෙවියන් වහන්සේ විශ්වය හා මිනිසා මැවීම
        - මිනිසා පාපයට වැටීම
        - ආදිපිතෘවරු
        - ඉශ්‍රායෙල්වරුන් ඊජිප්තුවේ වහල් සේවය
        - නික්මයාම
        - නික්මයාම ගමන තුළ දිව්‍ය සංරක්ෂණය

(මිනිත්තු 20)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. (මිනිත්තු 30)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.
    - පංච පුස්තකය රචනා වීමට දේව ධාර්මික සම්ප්‍රදයයන් හතරක් දයක වී ඇති බව
        1. යාවේ (J) සම්ප්‍රදය
            - දෙවියන් වහන්සේ ව "යාවේ" යන නමින් හැඳින්වීම නිසා මෙම නම මෙම සම්ප්‍රදායයට ලැබී ඇති බව

- කතන්දර ආකාරයෙන් දේව ධාර්මික පණිවිඩ ඉදිරිපත් කරයි. උදහරණ:- මැවීම පිළිබඳ දෙවන කථාව (උත්පත්ති 2/4ආ-25), ආදම් හා ඒව (උත්පත්ති 3), කායින් හා ආබෙල් (උත්පත්ති 4)
- දෙවියන් වහන්සේ මිනිසාට ඉතා සමීප ය. උදාහරණ:- ඒදන් උයන තුළ දී දෙවියන් වහන්සේ මිනිසා ව සොයා පැමිණීම (උත්පත්ති 3/8-9)

2. එලෝහිම් (E) සම්ප්‍රදය
   - දෙවියන් වහන්සේ ව "එලෝහිම්" යන නමින් හැඳින්වීම නිසා මෙම නම මෙම සම්ප්‍රදායයට ලැබී ඇති බව
   - දෙවියන් වහන්සේ මිනිසාට දුරින් වැඩ වසන සේක. මිනිසාට ඔවුන් වහන්සේට ළංවිය නොහැකි ය. උදහරණ:- ගිනිගත් නොදැවෙන කටු පඳුරට ළංවන විට මෝසෙස් තුමාට එයට ළං නොවීමට හා පාවහන් ඉවත් කිරීමට නියම කිරීම (නික්මයාම 3/5)
   - දෙවියන් වහන්සේ මිනිසාට කථා කරන්නේ දේව දූතයන්, සිහින හා දර්ශන තුළිනි.
3. පූජක (P) සම්ප්‍රදය
   - පූජකයන්ගේ ඉගැන්වීම් ගෙනහැර දක්වයි. උදහරණ:- මැවීමේ පළමු කථාව (උප්පන්නා 1/1-2/4අ)
     - මැවීමේ කථාව දින 7කට සීමා කරන්නේ දෙවියන් වහන්සේ දින 7කින් ලෝකය මැව් නිසා නොව සබත් දිනයේ උතුම්කම පෙන්වීමට ය.
     - එබැවින් සබත් දිනය දෙවියන් වහන්සේ වෙනුවෙන් ශුද්ධවන්ත ව ගත කරමින් දේව සබඳතාව වර්ධනය කර ගත යුතු ය.
4. ද්විතීය නීති (D) සම්ප්‍රදය
   - ද්විතීය නීති සංග්‍රහය පොතේ පමණක් ඇත.
   - මෝසෙස් තුමාගේ දේශනා ඉදිරිපත් කරයි.

- පංච පුස්තකයේ වැදගත්කම
  - විශ්වයේ මැව්මිකරුවාණන්ට පක්‍ෂපාත වීම ඉශ්‍රායෙල්වරුන්ගේ වගකීමකි.
  - දෙවියන් වහන්සේගේ කරුණාව හා ආදරය කරණ කොට ගෙන විශ්වයේ ගැලවීම සඳහා ඉශ්‍රායෙල් ජනතාව තෝරාගත් සේක.
  - එය ආදිපිතෘවරුන්ට දුන් පොරොන්දු ඉටු කිරීමකි.
  - දුබල මිනිසා ව හික්මවීමට දී ඇති නීති පිළිපැදීම තුළින් දේවාශිර්වාදය හිමි වේ.

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම්**

- ශුද්ධ බයිබලය
- ඇමුණුම 1
- ඇමුණුම 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

- පෙළපොතේ පළමු පාඩම කියවා, ඔබේ කණ්ඩායමට ලැබී ඇති මාතෘකාව පිළිබඳ නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් සඳහා සූදනම් වන්න.

  1 කණ්ඩායම: යාවේ (J) හා එලෝහිම් (E) සම්ප්‍රදායයන්

  2 කණ්ඩායම: පූජක (P) හා ද්විතීය නීති (D) සම්ප්‍රදායයන්

  3 කණ්ඩායම: පංච පුස්තකයේ වැදගත්කම

## ඇමුණුම 2

උත්පත්ති පොත — දෙවියන් වහන්සේ ලෝකය මැව් ආකාරය මම තමයි වාර්තා කරන්නේ.

ද්විතීය නීති සංග්‍රහය — ඔබ වාර්තා කරන ආකාරයට ම ද දෙවියන් වහන්සේ ලෝකය මැව්වේ?

උත්පත්ති පොත — නෑ, නෑ . දෙවියන් වහන්සේ ලෝකය මැව් ආකාරය හරියට ම විද්‍යානුකූල ව ලීවා නම් විද්‍යාවෙන් නොදියුණු ආදි කාලීන මිනිසාට එය තේරෙන්නේ නෑ. ඒක නිසා මම ඒවා වාර්තා කරන්නේ උපමා ආකාරයෙන්. මෙම උපමාවලින් කියන්නේ දෙවියන් වහන්සේ ලෝකය හා මිනිසා මවපු හැටි නොවේ, දෙවියන් වහන්සේ ලෝකය මැව්වා කියන එකයි. දෙවියන් වහන්සේ විශ්වයේ මැවුම්කරුවාණන් කියන එකයි.

ලෙවී ව්‍යවස්ථාව — එතකොට මිනිසා පාපයට වැටුණු හැටිත් ලියා තිබෙන්නේ උපමා ආකාරයෙන් ද?

උත්පත්ති පොත — ඔව්, ඔව්. එයින් කියන්නේ ලෝකය ආරම්භයේ සිට ම මිනිසා දෙවියන් වහන්සේට අකීකරු වුණා කියන එකයි.

ගණන් කථාව — මම අහලා තියෙන හැටියට නම්, මුල් පරිච්ඡේද 11හි ඔබ වාර්තා කරන කථා උපමා වුනාට ඒවා තුළ සෑම කාලයකට ම වලංගු දේව ධාර්මික පණිවිඩ රාශියක් තියෙනවා.

උත්පත්ති පොත — ඔව්, ඔව්. මගේ පණිවිඩය සර්ව කාලීන යි. එම පණිවිඩය අනුව ජීවත් වන අයට යි ගැලවීම ලැබෙන්නේ. ශුද්ධ බයිබලයේ පරමාර්ථය විද්‍යාව හෝ ඉතිහාසය ඉගැන්වීම නොවෙයි නේ. මිනිසාගේ ගැලවීම නේ.

නික්මයාම පොත — ඒකනේ මම වාර්තා කරන්නේ, ඉශ්‍රායෙල් ජනතාව පාරාවෝ රජතුමාගේ වහල් බැම්මෙන් ගලවා ගෙන පොරොන්දු දේශයට ගෙනයාම.

ද්විතීය නීති සංග්‍රහය — දෙවියන් වහන්සේ ඉශ්‍රායෙල් ජනතාව පොරොන්දු දේශය කරා ගෙන ගියා සේ අප සැමවත් දෙවියන් වහන්සේ ස්වර්ගය නමැති පොරොන්දු දේශයට ගෙන යාමට නියමිත යි.

ලෙවී ව්‍යවස්ථාව — විශ්වයේ හා මිනිසාගේ ආරම්භයත්, ආදිපිතෘවරුන්ගේ සිට ගැලවීමේ ඉතිහාසයත් වාර්තා කරන අපිට කියන පොදු නම දන්නවා ද?

| | |
|---|---|
| ගණන් කථාව | ඔව්, ඔව්, ඇයි අපි 6 ශ්‍රේණියේ දී ඉගෙන ගත්තේ "පංච පුස්තකය" කියලා. |
| නික්මයාම පොත | පංච පුස්තකය විතරක් නොවෙයි, ව්‍යවස්ථාවලිය, මෝසෙස් තුමාගේ ව්‍යවස්ථාව, නීතිය, මෝසෙස් තුමාගේ ව්‍යවස්ථාව කියලත් කියනවා. හෙබ්‍රෙව් බසින් නම් කියන්නේ "ටෝරා'' කියල යි. |

(මෙම දෙබස් රඟ දක්වන සිසුන් 5 දෙනාගේ ඇඳුම්වල පංච පුස්තකයේ පොත් 5හි නම් කාඩ් බෝඩ් 5ක ලියා අල්පෙනෙතිවලින් රඳවන්න)

**ගෙදර පරිසරයෙන්**

දේව ප්‍රේමයට ප්‍රතිප්‍රේමය දැක්වීමට හුරුවන්න.

## 02 වන පාඩම

## ද්විතීය සම්මත ග්‍රන්ථ

**නිපුණතාව 1.0** : ශුද්ධ බයිබලය පිළිබඳ අවබෝධය ලබා එදිනෙදා ජීවිතයේ දී ඵලදායී ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම 11.1.2** : ද්වීතීය සම්මත ග්‍රන්ථ දෛනික ජීවිතයේ දී ඵලදයී ව භාවිත කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- ද්විතීය සම්මත ග්‍රන්ථ පිළිබඳ කරුණු ගොනු කරයි.
- ද්විතීය සම්මත ග්‍රන්ථ දේව වචනය බව පිළිගනියි.
- ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- ද්විතීය සම්මත ග්‍රන්ථ දෛනික ජීවිතයේ දී ඵලදයී ව භාවිත කරයි.
- කණ්ඩායම් තුළ සහයෝගයෙන් කටයුතු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- ඇමුණුම 2ට අදළ පෝස්ටරය පංතියේ ප්‍රදර්ශනය කර, පහත සඳහන් කරුණු පදනම් කර ගෙන සාකච්ඡා කරන්න.
  - ජුදා බයිබලයේ ඇත්තේ පොත් 39ක් පමණක් බව
  - එම පොත් 39 ම පුරාණ ගිවිසුමට අයිති බව
  - ක්‍රිස්තියානි බයිබලයේ පොත් 66ක් ඇති බව
  - ඉන් පොත් 39ක් පුරාණ ගිවිසුමටත්, 27ක් නව ගිවිසුමටත් අයිති බව
  - කතෝලික බයිබලයේ පොත් 73ක් ඇති බව
  - එයින් 46ක් පුරාණ ගිවිසුමටත්, 27ක් නව ගිවිසුමටත් අයිති බව
  - ඒ අනුව කතෝලික බයිබලයේ පුරාණ ගිවිසුමට පොත් 7ක් වැඩිපුර ඇති බව
  - ඒම පොත් 7 ද්විතීය සම්මත ග්‍රන්ථ ලෙස හඳුන්වන බව

(මිනිත්තු 15)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. (මිනිත්තු 30)

පියවර 3

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.
    - ද්විතීය සම්මත ග්‍රන්ථ 7හි නම් (තෝබිත්, ජුඩිත්, සලමොන්ගේ ප්‍රඥාව, උපදේශකයා හෙවත් සිරාක්, බාරුක්, 1 මකබි හා 2 මකබි)
    - ද්විතීය සම්මත ග්‍රන්ථ ග්‍රීක පිටපතින් (සෙප්තුවාජින්තයෙන්) ලැබී ඇති බව
    - සෙප්තුවාජින්තය ක්‍රි.පූ. තෙවන සියවසේ පරිවර්තනය කරන ලද්දක් බව
    - සෙප්තුවාජින්තයේ ද්විතීය සම්මත ග්‍රන්ථ අනෙක් ග්‍රන්ථවලින් වෙන් නොකර අනෙක් ග්‍රන්ථ අතර ම යොදන බව උදහරණ:- නෙහෙමියා, <u>තෝබිත්</u>, <u>ජුඩිත්</u>, එස්තර්, ........ විලාප ගී, <u>බාරුක්</u>, එසකියෙල්
    - ඒ අනුව සම්මත හා ද්විතීය සම්මත යනුවෙන් භේදයක් එකල නොතිබුණු බව
    - සම්මත හා ද්විතීය සම්මත ග්‍රන්ථ එක ම ආකාරයෙන් සලකා ඇති බව
    - නව ගිවිසුමේ කතුවරුන් ද්විතීය සම්මත ග්‍රන්ථවලින් උපුටා ගැනීම් 18ක් කර ඇති බව
    - ද්විතීය සම්මත ග්‍රන්ථ දේවානුභාවයෙන් නොලිය වුණා නම් නව ගිවිසුමේ කතුවරුන් ඒවායින් උපුටා නොගන්නවා පමණක් නොව ඒවා භාවිත නොකරන ලෙස අවවාද කරන්නට ඉඩ තිබූ බව
    - නව ගිවිසුම සමයේ ද්විතීය සම්මත ග්‍රන්ථ ඇතුළත් සෙප්ටුවාජින්තය ජනවන්දනාව සඳහා භාවිත කළ බව
    - එබැවින් කතෝලික සභාව ද ද්විතීය සම්මත ග්‍රන්ථ දේව වචනය ලෙස සලකන බව
    - එබැවින් දේව වචනය ලෙස ද්විතීය සම්මත ග්‍රන්ථ පිළිගත යුතු බව
    - එබැවින් ද්විතීය සම්මත ග්‍රන්ථ එදිනෙද ජීවිතයේ දී ඵලදායී ව භාවිත කළ හැකි බව

(මිනිත්තු 35)

**ගුණාත්මක යෙදවුම්**

- ශුද්ධ බයිබලය
- ඇමුණුම 1
- ඇමුණුම 2හි ඇතුළත් පෝස්ටරය

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

- පෙළපොතේ දෙවන පාඩම කියවා, "ද්විතීය සම්මත ග්‍රන්ථ" පිළිබඳ ව නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න.

**ඇමුණුම 2**

(පහත සඳහන් වගුව ඇසුරෙන් පෝස්ටරයක් නිර්මාණය කරගන්න)

**ශුද්ධ බයිබලයේ පොත් ගණන**

| | පුරාණ ගිවිසුම | නව ගිවිසුම | එකතුව |
|---|---|---|---|
| ජුදා බයිබලය | 39 | - | 39 |
| ක්‍රිස්තියානි බයිබලය | 39 | 27 | 66 |
| කතෝලික බයිබලය | 46 | 27 | 73 |

**ගෙදර පරිසරයෙන්**

නිවසේ ශුද්ධ බයිබලයක් වැඩමවා තබන්න.

## 03 වන පාඩම

## දිවැසිවරු

**නිපුණතාව** **1.0** : ශුද්ධ බයිබලය පිළිබඳ අවබෝධය ලබා එදිනෙදා ජීවිතයේ දී ඵලදායී ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** **11.1.3** : තම දිවැසිවර කාර්ය වටහා ගෙන සාක්ෂි දරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- ඉශ්‍රායෙල් දිවැසිවරුන් පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- කිතුනුවකු ලෙස දිවැසිවර කැඳවීමක් ලබා ඇති බව පිළිගනියි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- තම දිවැසිවර කාර්ය වටහා ගෙන සාක්ෂි දරයි.
- දේව පණිවිඩයට ප්‍රතිචාර දැක්වීමට අන් අය යොමු කරවයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- සාත්තරකාරයකු අනුකරණය කරමින් සාත්තර කීමට සිසුවකුට අවස්ථාව ලබා දී පහත සඳහන් කරුණු උපයෝගි කරගනිමින් සාකච්ඡාවක් මෙහෙයවන්න. රගපෑමට දක්ෂ සිසුවකු කලින් සූදානම් කර තැබීම වඩාත් යෝග්‍යය ය.
    - සාත්තරකාරයකු අනාගතයේ දී අදාළ පුද්ගලයාට සිදුවන දේ පවසයි. (දිවැස් කියයි)
    - ඒ අනුව සාත්තරකාරයා අදළ පුද්ගලයාගේ ඉරණම ප්‍රකාශ කරයි.
    - සාත්තර ඇසීමට කිතුනුවාට නොහැකි බව
    - මන්ද ඉරණම කියා දෙයක් නොමැති අතර ඉරණම යනුවෙන් හඳුන්වන දේ දෙවියන් වහන්සේට වෙනස් කළ හැකි බව
    - එම නිසා ඉරණමට අනාගතය භාර දීම පාපයක්
    - මන්ද යත් සෑම පුද්ගලයාගේ ම අනාගතය සැලසුම් කරන්නේ දෙවියන් වහන්සේ
    - එබැවින් දේව හඬට ඇහුම්කන් දීම සැමගේ යුතුකම බව
    - දේව හඬ ප්‍රකාශ කරන්නේ දිවසිවරුන් බව
    - දිවැසිවරුන් දෙවියන් වහන්සේ වෙනුවෙන් කථා කරන බව
    - ඔහු දෙවියන් වහන්සේ වෙනුවෙන් කථා කරන්නේ පුද්ගලයාගේ ඉරණම නොව දේව පණිවිඩයට සවන් නොදෙන විට ලැබෙන ප්‍රතිවිපාක බව
    - දේව පණිවිඩය අනුව ජීවිතය සකස්කර ගැනීමෙන් ගැලවීම ලැබෙන බව

(මිනිත්තු 20)

පියවර 2

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර, ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල සිසුන් නිරත කරවා, සිසුන්ගේ ක්‍රියාකාරකම් සමීප ව නිරීක්ෂණය කරමින්, අවශ්‍ය මඟපෙන්වීම් ලබා දෙන්න.

(මිනිත්තු 30)

පියවර 3

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.
  - "නබී" හා "ප්‍රොෆෙටේස්" යන වචනවල අර්ථ
  - දිවැස්වැකි කීමේ දී භාවිත කරන ලද තුන් ආකාර පද මාලාව
    - "සමිඳාණන් වහන්සේ මෙසේ වදාරණ සේක"
    - "මෙසේ වදාරන්නේ සමිඳාණන් වන මම ය"
    - "සමිඳාණන් වහන්සේගේ පණිවිඩය ................ වෙත පැමිණියේ ය"
  - දිවැසිවරු ප්‍රධාන කොටස් 2කි.
    1. දේශක දිවැසිවරු
       - දේශක දිවැසිවරුන්ගේ නම් (නාතාන්, එලියා, එලිෂා, හුල්දා, අහියා හා මීකායා)
       - දේශක දිවැසිවරුන්ගේ ලක්ෂණ
         - ධ්‍යානයට සමවැදීම
         - කණ්ඩායම් වශයෙන් මෙහෙවරයෙහි යෙදීම
         - තම දූත මෙහෙවර සනාථ කිරීම සඳහා හාස්කම් කිරීම
       - මොවුන් නමින් පුරාණ ගිවිසුමේ ග්‍රන්ථ නොමැති වුව ද ඔවුන්ගේ වචන හා ක්‍රියා සාමුවෙල් හා රාජාවලිය ග්‍රන්ථවල ඇති බව
    2. ලේඛක දිවැසිවරුඃ මොවුන් නමින් ග්‍රන්ථ පුරාණ ගිවිසුමේ ඇත. ලේඛක දිවැසිවරු කොටස් 2කි.
       i. ප්‍රධාන දිවැසිවරුඃ 3කි. යෙසායා, ජෙරමියා සහ එසකියෙල්
       ii. සුළු දිවැසිවරුඃ 12කි. හොසියා, ජොවෙල්, ආමොස්, ඔබදියා, ජෝනා, මීකා, නාහුම්, හබක්කුක්, ශෙපනියා, හග්ගායි, සෙකරියා හා මලාකි.
  - ප්‍රධාන හා සුළු යන වර්ගීකරණයේ පදනම දිවැසිවර ග්‍රන්ථයේ විශාලත්වය යි.
  - ප්‍රධාන දිවැසිවරු තිදෙනාගේ කැඳවීම
    - යෙසායා 6/1-13,
    - ජෙරමියා 1/1-10, 1/17-19
    - එසකියෙල් 1/1-3, 1/15
  - සෑම කිතුනුවෙකු ම දිවැසිවරයකු ලෙස ප්‍රසාද ස්නාපනයේ දී කැඳවා ඇති බව
  - ඒ අනුව සෑම කිතුනුවෙකු ම දිවැසිවර කාර්යයේ නිරත විය යුතු බව

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම්**

- ශුද්ධ බයිබලය
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

- පෙළපොතේ තෙවන පාඩම කියවා, ඔබේ කණ්ඩායමට ලැබී ඇති මාතෘකාව පිළිබඳ නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න.

1 කණ්ඩායම : ඉශ්‍රායෙල්හි දිවැසිවරුන් පිළිබඳ හැඳින්වීමක්

2 කණ්ඩායම : දේශක දිවැසිවරු

3 කණ්ඩායම : ලේඛක දිවැසිවරු

4 කණ්ඩායම : ප්‍රධාන දිවැසිවරු තිදෙනාගේ කැඳවීම
(යෙසායා 6/1-13, ජෙරමියා 1/1-10, 1/17-19, එසකියෙල් 1/1-3, 1/15)

**ගෙදර පරිසරයෙන්**

සාත්තර ඇසීමෙන් වළකින්න.

## 04 වන පාඩම

### සුබාරංචි

**නිපුණතාව** 1.0 : ශුද්ධ බයිබලය පිළිබඳ අවබෝධය ලබා එදිනෙදා ජීවිතයේ දී ඵලදායී ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** 11.1.4 : තම ජීවිතයෙන් සුබාරංචියට සාක්ෂි දරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- සුබාරංචි හතර පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- අභියෝග හමුවේ විශ්වාසයට සාක්ෂි දැරිය යුතු බව පිළිගනියි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- තම ජීවිතයෙන් සුබාරංචියට සාක්ෂි දරයි.
- තම ජීවිතය අන් අයගේ ප්‍රීතියට හේතු වෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- මිනිසකුගේ, සිංහයකුගේ, ගවයකුගේ හා රාජාලියකුගේ වෙස් මුහුණු හතරක් සිසුන් හතර දෙනෙකුට පළඳවා, ඇමුණුම 2හි ඇති භූමිකා රංගනය පෙර පුහුණුවකින් යුතු ව පංතිය තුළ ක්‍රියාත්මක කරවා, පහත කරුණු ඇසුරෙන් සාකච්ඡාවක් කරන්න.
  - සුබාරංචි කතුවරුන් හතර දෙනාගේ නම්
  - ඒ අයගේ පෞද්ගලික තොරතුරු (2 ඇමුණුම ඇසුරෙන්)

(මිනිත්තු 15)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. (මිනිත්තු 30)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.
  - එක් එක් සුබාරංචිය ලියවුණු කාලය
    - මාක් : ක්‍රි.ව. 64-66
    - මතෙව් : ක්‍රි.ව. 80-90
    - ලූක් : ක්‍රි.ව. 80-85
    - ජොහන්: ක්‍රි.ව. 90-100

- එක් එක් සුබාරංචිය ලියවුණු ස්ථානය
    - මාක් : රෝමයේ දී
    - මතෙව්: සිරියා පලස්තීනයේ දී
    - ලූක්: සිරියේ අන්තියෝකියේ දී
    - ජොහන්: එපීසියේ දී
- එක් එක් සුබාරංචිය සඳහා භාවිත වන වෙනත් නම්
    - මාක් : දුක්ප්‍රාප්තියේ සුබාරංචිය
    - මතෙව්: ශු. සභාවේ සුබාරංචිය, දේව රාජ්‍යයේ සුබාරංචිය
    - ලූක්: දිළින්දන්ගේ සුබාරංචිය, අන්‍ය ජාතීන්ගේ සුබාරංචිය, දයාවේ සුබාරංචිය
    - ජොහන්: ආධ්‍යාත්මික සුබාරංචිය
- එක් එක් සුබාරංචියේ පරමාර්ථ
    - මාක් : නීරෝගේ පීඩනයට ලක් වූ කිතුනුවන් දිරිමත් කිරීම
    - මතෙව්: ජේසුස් වහන්සේ නව මෝසෙස් තුමා ය; නව මෙසියානික ගුරුවරයා ය.
    - ලූක්: ජේසුස් වහන්සේ ජුදා ජාතිකයන්ගේ පමණක් නොව මුලු ලෝක වාසීන්ගේ ම ගැලවුම්කරුවාණෝ ය.
    - ජොහන්: විශ්වාසය ඇති කිරීමට

(මිනිත්තු 35)

**ගුණාත්මක යෙදවුම්**

- ශුද්ධ බයිබලය
- ඇමුණුම 1 හා 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

- පෙළපොතේ හතරවන පාඩම කියවා, ඔබට ලැබී ඇති මාතෘකාව පිළිබඳ ව නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න.

| | | |
|---|---|---|
| 1 කණ්ඩායම | : | මාක් සුබාරංචිය |
| 2 කණ්ඩායම | : | මතෙව් සුබාරංචිය |
| 3 කණ්ඩායම | : | ලූක් සුබාරංචිය |
| 4 කණ්ඩායම | : | ජොහන් සුබාරංචිය |

**ඇමුණුම 2**

| | |
|---|---|
| මිනිසා | මම තමයි මතෙව් සුබාරංචියේ සංකේතය. මතෙව් සුබාරංචිය ලීවේ ශු. මතෙව් තුමා. එතුමා ජේසුස් වහන්සේගේ අපෝස්තුලුවරයෙක්. එතුමාගේ පියා අල්පේවුස්. කැඳවීමට පෙර එතුමා අයබදු එකතු කරන අයකැමියෙක්. |
| සිංහයා | මම තමයි මාක් සුබාරංචියේ සංකේතය. මාක් සුබාරංචිය රචනා කළේ ජොහන් මාක්. එතුමාගේ මව මරියා. එතුමා ශු. පේදුරු තුමාගේ ගෝලයෙක් වගේ ම ශු. පේදුරු තුමාගේ භාෂා පරිවර්තකයා. පේදුරු තුමාගේ භාෂා පරිවර්තකයා ලෙස ජේසුස් වහන්සේ පිළිබඳ බොහෝ තොරතුරු ශු. පේදුරු තුමාගෙන් දැන ගන්නට ඇත. |
| ගවයා | මම තමයි ලූක් සුබාරංචියේ සංකේතය. ශු. ලූක් තුමා ඉතිහාසඥයෙක්; චිත්‍ර ශිල්පියෙක්; වෛද්‍යවරයෙක්; සුබාරංචියක් ලියන ලද එක ම අන්‍ය ජාතිකයා. ලූක් සුබාරංචියට අමතර ව අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතත් ලීවා. එය තමා ලූක් සුබාරංචියේ දෙවන කොටස. |
| රාජාලියා | මම තමයි ජොහන් සුබාරංචියේ සංකේතය. ජොහන් තුමා ජේසුස් වහන්සේගේ අපෝස්තුලුවරයෙක්. එතුමාගේ සහෝදරයා මහා ජාකොබ් තුමා. එතුමාත් ජේසුස් වහන්සේගේ අපෝස්තුලුවරයෙක්. ජේසුස් වහන්සේගේ අපෝස්තුලු වරුන් වීමට පෙර මෙම දෙදෙනා ධීවරයෝ. සෙබදි හා සලෝමි මෙම අපෝස්තුලුවරුන් දෙදෙනාගේ දෙමව්පියන් ය. |

**ගෙදර පරිසරයෙන්**

අභියෝග හමුවේ විශ්වාසයේ ජීවිතයක් ගත කරන්න දරුවන් හුරුකරවන්න.

## 05 වන පාඩම

### මැවීම

**නිපුණතාව 2.0 :** දේව අනාවරණයට ප්‍රතිචාර දක්වමින් විශ්වාසයේ ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 11.2.1 :** මැවිල්ලේ මනහර බව අත්දකිමින් දෙවියන් වහන්සේට ප්‍රශංසා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් පල**

- උත්පත්ති පොතේ සඳහන් මැවීමේ කථා පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- දෙවියන් වහන්සේ විශ්වයේ මැව්මකරුවාණන් බව පිළිගනියි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- මිනිස් බවේ උතුම්කම රැකෙන අයුරින් ජීවත් වෙයි.
- ස්ත්‍රී-පුරුෂ වෙනස්කම්වලට ගරු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- විශ්වය හා මිනිසාගේ ආරම්භය පිළිබඳ විද්‍යාවේ දී ඉගැන්වෙන මත වාදයන් විමසා, පහත සඳහන් කරුණු පදනම් කරගෙන සාකච්ඡාවක් කරන්න.
    - විශ්වය හා මිනිසාගේ ප්‍රභවය පිළිබඳ විද්‍යාවේ දී ඉගැන්වෙන්නේ වාදයන් බව
    - වාදයන් සත්‍යය වීමට හෝ අසත්‍යය වීමට ඉඩ ඇති බව
    - ඒවා සත්‍යය වුව ද ගැටලුවක් නැති බව
    - මන්ද ඒවා සත්‍ය වුවහොත් සොයාගනු ලබන්නේ දෙවියන් වහන්සේ ලෝකය මැව් ආකාරය බව
    - ශුද්ධ බයිබලයේ අනාවරණය කරන්නේ දෙවියන් වහන්සේ ලෝකය මැව් ආකාරය නොව දෙවියන් වහන්සේ ලෝකය මැවූ බව
    - දෙවියන් වහන්සේ ලෝකය මැවූ ආකාරය සොයා ගැනීම සඳහා මිනිසාට බුද්ධියක් දුන් බව

(මිනිත්තු 15)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. (මිනිත්තු 30)

පියවර 3

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.
    - ප්‍රාග් ඉතිහාසය පිළිබඳ හැඳින්වීමක්
    - ප්‍රාග් ඉතිහාසයට අයත් වන්නේ උත්පත්ති 1-11
    - ප්‍රාග් ඉතිහාසය යනු ඉතිහාසයට පෙර යන්න යි
    - ඉතිහාසයට පෙර යුගය පිළිබඳ අධ්‍යයනයේ දී ඓතිහාසික කරුණු ගවේෂණය කළ නොහැකි බව
    - විශ්වයේ හා මිනිසාගේ ආරම්භය දෙවියන් වහන්සේගෙන් බව ඉගැන්වෙන උපමා කථා එහි අඩංගු  බව
    - උපමා කථාවල පරමාර්ථය යම් පණිවිඩයක් දීම විනා කරුණු සිදු වූ ආකාරය ඉගැන්වීම නොවේ
    - දෙවියන් වහන්සේ විශ්වය හා මිනිසා මැවූ බව සර්ව කාලීන සත්‍යයක් වන අතර ඔවුන් වහන්සේ එසේ කළේ කෙසේ ද යන්න සොයා ගැනීමට මිනිසාට බුද්ධියක් දී ඇති බව
- මැවීම පිළිබඳ කථා දෙකක් ඇති බව
    1. උත්පත්ති 1/1-2/4අ
    2. උත්පත්ති 2/4ආ-25
- මැවීම පිළිබඳ පළමු කථාව
    - පූජක සම්ප්‍රදායට අයිති බව
    - පූජක සම්ප්‍රදයයට සබත් දිනය වැදගත් බව
    - එබැවින් මැවීම දින 7කට සීමා කර ඇති බව
    - එයින් ගෙනෙන දේව ධාර්මික පණිවිඩය වන්නේ දෙවියන් වහන්සේ දින 6ක් තුළ ලෝකය මවා 7වන දින නිවාඩු ගත්තා සේ මිනිසා ද දින 6ක් තුළ වැඩ කර 7වන දින නිවාඩු ගෙන දෙවියන් වහන්සේ වෙනුවෙන් ශුද්ධ ලෙස ගත කළ යුතු ය.
    - දෙවියන් වහන්සේ තම ස්වරූපය හා සමානකම අනුව මවන්නේ මිනිසා පමණක් බව
    - දේව ස්වරූපයේ ලක්ෂණ
        1. බුද්ධිය
        2. නිදහස් කැමැත්ත
        3. අමරණීය ආත්මය
    - අන් මැවිලිවලට මෙම ලක්ෂණ නොමැත
    - එබැවින් මිනිසා සියලු මැවිලි අතර උතුම් ම මැවිල්ල බව
- මැවීම පිළිබඳ දෙවන කථාව
    - යාවේ සම්ප්‍රදයයට අයත් වේ
    - මැවීමේ දෙවන කථාව අනුව ද මැවිලි අතර උතුම් ම මැවිල්ල වන්නේ මිනිසා
    - මන්ද අන් මැවිලිවලට ජීවන හුස්ම හෙළීමක් නැති බව
    - ස්ත්‍රිය මවන්නේ පුරුෂයාගේ ඉළ ඇටයකින්

- ඉල ඇටයක් යනු හදවතට සමීප ම ස්ථානයකින් ගත් දෙයක්
- එයින් පෙන්නුම් කරන්නේ සැමියා හා බිරිඳ ප්‍රේමයෙන් ජීවත් වීමට මවා ඇති බව
- ඒ අනුව දෙදෙනා එකිනෙකාට ගෞරව කරමින් ප්‍රේමයෙන් ජීවත් විය යුතු ය

- එදිනෙද ජීවිතයේ ස්ත්‍රී-පුරුෂ වෙනස්කම්වලට ගරු කරමින් තම අභිමානය රැකගත යුතු බව
- මැවිලි අතර උතුම් ම මැවිල්ල ලෙස එයට ගැළපෙන ලෙස චර්යා සකස් කර ගත යුතු බව

(මිනිත්තු 35)

**ගුණාත්මක යෙදවුම්**

- ශුද්ධ බයිබලය
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

ඇමුණුම 1

- පෙළපොතේ පස්වන පාඩම කියවා, ඔබට ලැබී ඇති මාතෘකාව පිළිබඳ ව නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න.

| | | |
|---|---|---|
| 1 කණ්ඩායම | : | ප්‍රාග් ඉතිහාසය |
| 2 කණ්ඩායම | : | මැවීම පිළිබඳ පළමු කථාව |
| 3 කණ්ඩායම | : | මැවීම පිළිබඳ දෙවන කථාව |

**ගෙදර පරිසරයෙන්**

පවුලේ එකිනෙකාට ගරු කරන්න.

## 06 වන පාඩම

## මිනිසා පාපයට වැටීම

**නිපුණතාව 2.0** : දේව අනාවරණයට ප්‍රතිචාර දක්වමින් විශ්වාසයේ ජීවිතයක් ගත කරයි.
**නිපුණතා මට්ටම 11.2.2**: හොඳ නරක අවබෝධ කරගනිමින් පාපයේ වහල් බවින් මිදීම ලබයි.
**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- මිනිසා පාපයට වැටීම පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- හෘද සාක්ෂියට අවනත විය යුතු බව පිළිගනියි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- රුචියට වහල් නොවී නිවැරදි තීරණ ගනියි.
- නිවැරදි මග පෙන්වන අයට කීකරු වෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- ඇමුණුම 2හි ඇති දෙබස පෙර පුහුණුවකින් පංතියට ඉදිරිපත් කර, පහත කරුණු පදනම් කරගෙන සාකච්ඡාවක් කරන්න.
    - රඹුටන් දුටු විට ළමුන්ගේ රුචිය කථා කළ බව
        - "ලස්සන රඹුටන්"
        - "මැලේසියන් රඹුටන්"
        - "ගොඩක් රස ඇති"
        - කෑමට පෙර පවා රස ගැන තීරණය කර නිම වී ඇති බව
    - රුචිය යහපත් හෝ අයහපත් නොවන බව
    - රුචිය මත ගන්නා තීරණය යහපත් හෝ අයහපත් වන බව
    - එම නිසා රුචියට වහල් වී වැරදි තීරණ නොගත යුතු බව

(මිනිත්තු 15)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. (මිනිත්තු 30)

පියවර 3

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.
  - ආදම් හා ඒව (උත්පත්ති 3)
    - ස්ත්‍රිය පරීක්ෂා කරනු ලබන්නේ සර්පයා ය.
    - සර්පයා තුළින් මිනිසාගේ රුචිය සංකේතවත් කරන බව
    - රුචිය ස්ත්‍රියට කථා කරයි.
      - ගස කෙතරම් රමණීය ද (උත්පත්ති 3/6)
      - පල කෙතරම් ප්‍රනීත ද (උත්පත්ති 3/6)
      - නුවණ වැඩුමට කෙතරම් කදිම ද (උත්පත්ති 3/6)
      - කෑමට පෙර පවා පලවල ප්‍රනීත බව තීරණය කර ඇත. නුවණ වැඩුමට යෝග්‍යය බව තීරණය කර ඇත.
    - රුචියට වහල් වී වැරදි තීරණ නොගත යුතු බව
    - හෘද සාක්ෂියට අවනත විය යුතු බව
- දෙවියන් වහන්සේ අපට අදරැති පියෙකි.
- එබැවින් ඔවුන් වහන්සේ අපට වැරදි මග යන්නට නොදී අවවාද කරන සේක
- ආදම් සහ ඒවටත්, කායින්ටත් දෙවියන් වහන්සේ අවවාද කළ සේක. (උත්පත්ති 2/17, 4/6-7)
- අපට ද දෙවියන් වහන්සේ, හෘදය සාක්ෂිය, දෙමව්පියන්, වැඩිහිටියන් යනාදි අය තුළින් අවවාද කරන සේක.
- ආදම් සහ ඒවත්, කායිනුත් දෙවියන් වහන්සේගේ අවවාදයට පිටුපෑහ. (උත්පත්ති 3/6, 4/8)
- අපට නිතර ම මග පෙන්වන දෙමාපියන්, ගුරුවර-ගුරුවරියන්, ආගමික නායකයන්ට අවනත විය යුතු බව
- ආදම් සහ ඒවගෙනුත්, කායින්ගෙනුත් ප්‍රශ්න කර, දෙවියන් වහන්සේ ඔවුන්ට දඬුවම් දුන් සේක (උත්පත්ති 3/11-19, 4/).
- දෙවියන් වහන්සේ ආදම් හා ඒවටත්, කායින්ටත් කරුණාව දැක් වූ සේක.(උත්පත්ති 3/15, 3/21,4/15)
- නෝවා (උත්පත්ති 6/1-9/17)
  - ජල ගැල්මට හේතුවඃ මිනිසාගේ පාපය
  - ජල ගැල්මේ පරමාර්ථයඃ පාපය මෙලොවින් තුරන් කිරීම
  - දේව කරුණාවඃ නව මැවිල්ලක ආරම්භකයා ලෙස නෝවාගේ පවුල සහ සතුන්ගේ නියෝජිතයන් බේරා ගැනීම

(මිනිත්තු 35)

**ගුණාත්මක යෙදවුම්**

- ශුද්ධ බයිබලය
- ඇමුණුම 1 හා 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

- ශුද්ධ බයිබලය / පෙළ පොතේ හයවන පාඩම කියවා, ඔබට ලැබී ඇති මාතෘකාව පිළිබඳ ව නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න.

| | | |
|---|---|---|
| 1 කණ්ඩායම | : | උත්පත්ති 3 අනුව ලැබෙන පණිවිඩ |
| 2 කණ්ඩායම | : | උත්පත්ති 4 අනුව ලැබෙන පණිවිඩ |
| 3 කණ්ඩායම | : | නෝවා සහ ජල ගැල්ම අනුව ලැබෙන පණිවිඩ |

**ඇමුණුම 2**

| | | |
|---|---|---|
| මල්ලී | : | අක්කේ, මේ බලන්නකෝ ලස්සන රඹුටන් ගොඩක්. |
| අක්කා | : | ඔව් ම නේන්නම්, අපි ඉස්කෝලේ ගිය වෙලාවේ අම්ම පොළට ගියානේ, අම්මා පොළෙන් ගේන්න ඇති. |
| මල්ලී | : | මෙව්වා නම්, මැලේසියන් රඹුටන් වෙන්න ඇති. |
| අක්කා | : | මැලේසියන් රඹුටන් නම් ගොඩක් රසයි. |
| මල්ලී | : | අපි කමු ද අක්කේ? |
| අක්කා | : | මෙව්වා අම්මා අපට වෙන්න ඇති ගේන්න ඇත්තේ? අපි කමු. |
| මල්ලී | : | හරිම රහයි අක්කේ. |
| අක්කා | : | ඒක නේන්නම්. |
| මල්ලී | : | රඹුටන් ටික ඔක්කොම ඉවරයි. |
| අක්කා | : | තාත්තා වැඩට ගිහින් අම්මත් එකක් වත් කන්න නැති ව ඇති. |
| මල්ලී | : | අන්න අම්මා එනවා. දැන් අපිට අම්ම හොඳට බනියි. අපි හැංගෙමු. |
| අම්මා | : | කෝ මේ දරුවෝ? ඉස්කොලේ ගිහින් තවම ඇවිත් නැද්ද? |
| අක්කා | : | අපි ආවා අම්මේ? |
| අම්මා | : | එහෙනම් මොකද හැංගිලා? ආ මේ ළමයි ඔක්කොම රඹුටන් ටික කාලා. තාත්තටයි මටයි, එකක්වත් තියලා නෑ. |

**ගෙදර පරිසරයෙන්**

හෘද සාක්ෂිය අනුව කටයුතු කරන්න දරුවන් හුරු කරවන්න.

## 07 වන පාඩම

## නික්මයාම

**නිපුණතාව 2.0** : දේව අනාවරණයට ප්‍රතිචාර දක්වමින් විශ්වාසයේ ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 11.2.3** : එදිනෙදා ජීවිතය තුළ දිව්‍ය සංරක්ෂණය අත්දකියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- නික්මයාම පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- දේව රැකවරණය ලැබීමට දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් ජීවත් විය යුතු බව පිළිගනියි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- එදිනෙදා ජීවිතය තුළ දිව්‍ය සංරක්ෂණය අත්දකියි.
- අන් අයගේ කරදරවල දී පිහිට වෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- ඇමුණුම 2 ක්‍රියාත්මක කර, පහත කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් කරන්න.
- එබ්‍රහම් ලින්කන් අන් අයගේ විමුක්තිය වෙනුවෙන් ජීවිතය පරිත්‍යාග කළ බව
- ඉශ්‍රායෙල් ජනතාව ද, එක් යුගයක මිසරයේ වහලුන් ලෙස සිටි බව
- ඉශ්‍රායෙල් ජනතාව වහල්කමින් මුදා ගැනීමට දෙවියන් වහන්සේ මෝසෙස් තුමා කැඳවූ බව

(මිනිත්තු 15)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. (මිනිත්තු 30)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.
  - ඉශ්‍රායෙල් ජනයාගේ වහල් සේවයේ පසුබිම. (නික්මයාම 1/1-22)
  - ඉශ්‍රායෙල් ජනතාවගේ වර්ධනය, මර්දනය කිරීමට ගත් පියවර
    1. බර වැඩ පැවරීම
    2. තිඹිරි ගෙයි දී ම පිරිමි බිළිඳුන් මැරීම
    3. උපදින සියලු ම පිරිමි දරුවන් නයිල් ගඟට දැමීම

- මෝසෙස් තුමාගේ උපත (නික්මයාම 2/1-10)
- මෝසෙස් තුමාගේ කැඳවීම (නික්මයාම 3/1-6)
- දෙවියන් වහන්සේ නොදැවෙන ගිනි පඳුර මගින් මෝසෙස් තුමාට දර්ශනය වූ බව
- දෙවියන් වහන්සේ ඉශ්‍රායෙල් ජනතාව මිසරයේ වහල්කමින් ගලවා ගැනීම සඳහා මෝසෙස් තුමා ව කැඳවූ බව.
- මිසරයේ ජනතාවට එවූ වසංගත 10
- ඉශ්‍රායෙල් ජනතාව රතු මුහුද තරණය කිරීම (නික්මයාම 14/15-31)
- රතු මුහුදින් එතර වීම සොබා දහම තුළින් දෙවියන් වහන්සේ අනාවරණය වීමක් බව
- දෙවියන් වහන්සේගේ බල පරාක්‍රමය ඉශ්‍රායෙල් ජනතාව අත් දුටු බව
- පාළුකරයේ දිව්‍ය සංරක්ෂණය (නික්මයාම 15/22-25) මාරාහි දී ජලය ලැබීම
  පාළුකරයේ දී මන්නා හා වටුවන් ලැබීම
  මස්සා හා මෙරිබාහි දී ජලය ලැබීම (නික්මයාම 17/1-7)
- පාළුකරයේ දී දෙවිඳුන්ගේ වැඩ සිටීම හා දිව්‍ය සංරක්ෂණය ඉශ්‍රායෙල් ජනතාව අත්දුටු බව
- දේව රැකවරණය ලැබීමට අප ද දෙවියන් වහන්සේ කෙරෙහි දැඩි විශ්වාසයකින් ජීවත් විය යුතු බව
- සැම අවස්ථාවක ම අපට දෙවියන් වහන්සේගෙන් රැකවරණය ලැබෙන බව

(මිනිත්තු 35)

**ගුණාත්මක යෙදවුම්**

- ශුද්ධ බයිබලය
- බ්‍රිසිල් බෝඩ් හා ඩිමයි, ජ්ලැටිග්නම්
- ඇමුණුම 1 හා 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

- පෙළපොතේ 7වන පාඩම කියවා ඔබට ලැබී ඇති මාතෘකා පිළිබඳ නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න.

**1 කණ්ඩායම**

මෝසෙස් තුමාගේ උපත හා කැඳවීම

**2 කණ්ඩායම**

දෙවියන් වහන්සේ මිසර ජනතාවට එවූ වසංගත 10 හා රතු මුහුද තරණය

**3 කණ්ඩායම**

පාළුකරයේ දිව්‍ය සංරක්ෂණය

## ඇමුණුම 2
## ඒබ්‍රහම් ලින්කන්

ඇමරිකා එක්සත් ජනපදයේ හිටපු ජනාධිපතිවරයෙකු වූ ඒබ්‍රහම් ලින්කන් ජනාධිපතිවරණයට තරඟ කරද්දී ඒ රටේ වහල් සේවය මුල් බැස ගෙන තිබුණි. එකල බොහෝ රටවල වහල් සේවය ද පැවතියේ ය. වහල් සේවකයා දිවි පවත්නා තෙක් තම ස්වාමියාට පඩි රහිත ව සේවය කළ යුතු විය. ඒ ම්ලේච්ඡ වහල් සේවය ලින්කන් හෙළා දැක්කේ ය.

ඔහු ඇමරිකාවේ ජනාධිපති වූ පසු ව වහල් සේවය එරටින් ඉවත් කිරීමට නීති සම්මත කළේ ය. එම ආදර්ශය අනුව පසු ව මුළු ලෝකයෙන් ම වහල් සේවය ඉවත් කෙරිණි. මේ ශ්‍රේෂ්ඨ ක්‍රියාව නිසා ම සතුරකුගේ මාරක වෙඩි පහරින් ඔහු ජීවිතක්ෂයට පත් විය. එහෙත් ඒ උත්තරීතර නාමය අදත් අරමණීයයි. මානව වංශ කතාවට ඒබ්‍රහම් ලින්කන් නාමය එක් වූයේ එසේ ය.

(පන්තිය ඉදිරියේ කතන්දරයක් ලෙස කියන්න.)

**ගෙදර පරිසරයෙන්**

අන් අයගේ දුකේ දී පිහිටවීමට දරුවන් හුරු කරවන්න.

## 08 වන පාඩම

## සීනයි ගිවිසුම

**නිපුණතාව 2.0** : දේව අනාවරණයට ප්‍රතිචාර දක්වමින් විශ්වාසයේ ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 11.2.4**: ගැලවීමේ ක්‍රියාකාරිත්වය ග්‍රහණය කර ගනිමින්, පොරොන්දුවලට විශ්වාසවන්ත වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- දෙවියන් වහන්සේ මිනිසා සමග ඇති කර ගත් ගිවිසුම් පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- දේව පනත් පිළිපැදිය යුතු බව පිළිගනියි.
- ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- සදාචාර සම්පන්න ජීවිතයක් ගත කරයි.
- අන් අයට දුන් පොරොන්දු ඉටු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- කාලීන ගිවිසුමක් පිළිබඳ පුවත්පත් වාර්තාවක් කියවා පහත කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් කරන්න.
- ගිවිසුමක් යනු කණ්ඩායම් දෙකක් හෝ පුද්ගලයන් දෙදෙනෙකු අතර ඇතිවන කොන්ත්‍රාතුවකි.
- සීනයි ගිවිසුම දෙවියන් වහන්සේ හා මිනිසා අතර ඇති කරගත් ද්විපාර්ශික ගිවිසුමකි.
- එහි අන් ගිවිසුම්වලට වඩා විශේෂත්වයක් හා ඊට ආවේණික වූ අනන්‍යතාවක් දැකිය හැකි බව
  1. එයට මුල පිරුවේ දෙවි සමිදාණන් වහන්සේ ම ය.
  2. දෙවි සමිදාණන් හා මිනිසා අතර විශාල පරතරයක් තිබුණ ද දෙවිදාණෝ එය අනුමත කළ සේක.

(මිනිත්තු 15)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. (මිනිත්තු 30)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
- ආදම් සමග ගිවිසුම (උත්පත්ති 3/15)
- දෙවියන් වහන්සේට අකීකරු වූ මිනිසාට දේව සබඳතාව අහිමි වූ බව
- මිනිසාට අනුකම්පා කළ දෙවියන් වහන්සේ ඔහුට විමුක්තියේ පොරොන්දුවක් දුන් බව
- පාපයේ වහල්කමින් මිනිසා මුදා ගැනීම සඳහා ගැලවුම්කාරයකු එවීමට පොරොන්දු වූ බව

- නෝවා සමග ගිවිසුම හා ගිවිසුමේ ලකුණ (උත්පත්ති 9/8-11)
  - පාපය වර්ධනය වීම නිසා පාපය තුරන් කිරීමට ජල ගැල්ම ඇති වූ බව
  - මින් පසු කවරදාවත් ජල ගැල්මකින් ලෝකය විනාශ නොකිරීමට ගිවිසුමක් ඇති කර ගත් බව
  - ගිවිසුමේ සළකුණ දේදුන්න බව
- ආබ්‍රහම් සමග ගිවිසුම හා ගිවිසුමේ ලකුණ (උත්පත්ති 15/1-21, 17/1-14)
- ගිවිසුමේ වැදගත් කරුණු 2 කි.
  1. අසංඛ්‍ය වූ දරු පරපුරක් (උත්පත්ති 15/5, 17/6)
  2. සදාකාලයට ම හිමි වන දේශයක් (උත්පත්ති 15/21, 17/8)
- ගිවිසුමේ ලකුණ (චර්මච්ඡේදනය) උත්පත්ති 17/10-14)
- සීනයි ගිවිසුම හා දස පනත (නික්මයාම 20 පරිච්ඡේදය)
- ඉශ්‍රායෙල් ඉතිහාසය තුළ වඩාත් ම වැදගත් වන්නේ සීනයි ගිවිසුම බව
- සීනයි ගිවිසුමේ හරය දස පනත මගින් පෙන්නුම් කරන බව
- මෙය සර්ව කාලන නීති පද්ධතියක් බව
- දස පනත අනුව අප ජීවත් විය යුතු බව
- ප්‍රසාද ස්නාපනය මගින් අප ගිවිසුම් ජීවිතයට ඇතුළත් වන බව
- පොරොන්දුවලට විශ්වාසවන්ත ව ජීවත් විය යුතු බව
- අන් අයට දුන් පොරොන්දු ඉටු කළ යුතු බව

(මිනිත්තු 35)

**ගුණාත්මක යෙදවුම්**

- ශුද්ධ බයිබලය
- බ්‍රිසිල් බෝඩ් / ඩිමයි, ජ්ලැටිග්නම්
- ඇමුණුම 1
- කාලීන ගිවිසුමක් පිළිබඳ පුවත්පත් වාර්තාවක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

- පෙළපොතේ 08 වන පාඩම කියවා ඔබට ලැබී ඇති ගිවිසුම පිළිබඳ ව නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න.

| | | |
|---|---|---|
| 1 කණ්ඩායම | : | දෙවියන් වහන්සේ ආදම් සමග කළ ගිවිසුම |
| 2 කණ්ඩායම | : | දෙවියන් වහන්සේ නෝවා සමග කළ ගිවිසුම |
| 3 කණ්ඩායම | : | දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමග කළ ගිවිසුම |
| 4 කණ්ඩායම | : | සීනයි ගිවිසුම |

**ගෙදර පරිසරයෙන්** :

සාරධර්ම පිළිපැදීමට දරුවන්ව යොමු කරවන්න.

## 09 වන පාඩම

## ස්නාවක ජුවාම් තුමා

**නිපුණතාව 2.0 :** දේව අනාවරණයට ප්‍රතිචාර දක්වමින් විශ්වාසයේ ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 11.2.5:** ස්නාවක ජුවාම් තුමා අනුකරණය කරමින් වර්තමාන සමාජය තුළ දිවැසිවරයෙකු වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් පල**

- ස්නාවක ජුවාම් තුමා පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- ස්නාවක ජුවාම් තුමාගේ ඉගැන්වීම් අනුව ජීවත් විය යුතු බව පිළිගනියි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- සමාජය තුළ දිවැසිවරයෙකු ලෙස කටයුතු කරයි.
- තමන් සතු දේ අන් අය සමග බෙදා ගනියි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- ස්නාවක ජුවාම් තුමාගේ පින්තූරයක් පන්තියේ ප්‍රදර්ශනය කර පහත සඳහන් කරුණු පදනම් කරගෙන සාකච්ඡාවක් කරන්න.
- ස්නාවක ජුවාම් තුමා පාළුකරයේ වනවාසී ව චාම් ජීවිතයක් ගත කළ බව
- ක්‍රිස්තුන් වහන්සේගේ පෙරමග සූදානම් කළ බව
- මනස්තාප වී ජීවිත සකස් කර ගන්නට ස්නාවක ජුවාම් තුමා ජනතාව කැඳවූ බව
- ස්නාවක ජුවාම් තුමා පැරණි ගිවිසුම හා නව ගිවිසුම යා කරන දිවැසිවරයා බව

(මිනිත්තු 10)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. (මිනිත්තු 35)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න
    - ස්නාවක ජුවාම් තුමාගේ උපත දැනුම් දීම (ලූක් 1/5-25)
    - මිනිසාට කළ නොහැකි දේ දෙවියන් වහන්සේට කළ හැකි බව
    - ස්නාවක ජුවාම් තුමාගේ උපත (ලූක් 2/57/-66)
    - මව් කුස තුළ දී ම ජන්ම පාප දෝෂයෙන් මිදුණු ස්නාවක ජුවාම් තුමාගේ උපත අති විශේෂ බව
    - ස්නාවක ජුවාම් තුමාගේ දේශනය (ලූක් 3/1-18)
    - ස්නාවක ජුවාම් තුමා ප්‍රභූන් අමතමින් (ලූක් 3/11)
      මනස්තාපනය තුළින් සැබෑ ජීවිත වෙනසක් ඇති කර ගත යුතු බව

- පොදු ජනතාව අමතමින් දුන් පණිවිඩය (ලූක් 3/11)
  බෙදාහදා ගැනීමේ දිවි පෙවෙතක් ගත කළ යුතු බව
- අයකැමියන් අමතමින් දුන් පණිවිඩය (ලූක් 3/13)
  බදු අය කළ යුත්තේ යුක්තිය, සාධාරණත්වය මත බව
- සෙබලුන්ට දුන් පණිවිඩය (ලූක් 3/14)
  තම වැටුපට සරිලන සේවයක් කිරීමේ වැදගත්කමත්, මානව දයාවට හා පොදු යහපතට මුල්තැන දිය යුතු බව
- ස්නාවක ජුවාම් තුමාගේ මරණය (මතෙව් 14/1-12)
- එතුමා හෙරෝද් රජුගේ අයහපත් ජීවිත පැවැත්ම ගැන ප්‍රසිද්ධියේ කථා කළ බව
- එතුමා කිසිවකුගේ තරාතිරම් නොබලා සත්‍යය හා යුක්තිය ප්‍රකාශ කළ  බව
- තම දිවැසි කාර්යයට සාක්ෂි දරන්නන් මරණය ඉදිරියේ පවා සත්‍යවාදී වන බව
- ප්‍රසාද ස්නාපනය තුළින් අප ලැබූ දිවැසි කාර්යයට සාක්ෂි දැරිය යුතු බව

(මිනිත්තු 35)

**ගුණාත්මක යෙදවුම්**

- ශුද්ධ බයිබලය
- බ්‍රිසිල් බෝඩ් / ඩිමයි, ප්ලැටිග්නම්
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ  ඉගෙනුම් පල සාධනය  වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු  ආකාරයේ  නිර්ණායක  සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

ඇමුණුම 1

| | | |
|---|---|---|
| 1 කණ්ඩායම | : | ලූක් 1/5-25 කියවා, ස්නාවක ජුවාම් තුමාගේ උපත දැනුම්දීමේ සිද්ධිය භූමිකා රංගනයකින් ඉදිරිපත් කරන්න. |
| 2 කණ්ඩායම | : | ලූක් 2/57-66 කියවා, ස්නාවක ජුවාම් තුමාගේ උපත නිර්මාණශීලී ව ඉදිරිපත් කරන්න. |
| 3 කණ්ඩායම | : | ලූක්  3/1-20 කියවා, ස්නාවක ජුවාම් තුමාගේ දේශයෙන් අද සමාජයට ලබා දෙන පණිවිඩ නිර්මාණශීලී ව ඉදිරිපත් කරන්න. |
| 4 කණ්ඩායම | : | මතෙව් 14/1-12 කියවා,  සත්‍ය වෙනුවෙන් ජීවිතය පූජා කළ ස්නාවක ජුවාම් තුමාගේ ජීවිතයෙන් ඔබට ලැබෙන ආදර්ශ නිර්මාණශීලී ව ඉදිරිපත් කරන්න. |

**ගෙදර පරිසරයෙන්**

ධාර්මිෂ්ඨ  ජීවිතයක් ගත කිරීමට දරුවන් හුරු කරවන්න.

## 10 වන පාඩම

## ජේසුස් වහන්සේගේ දූත මෙහෙවර

**නිපුණතාව 2.0** : දේව අනාවරණයට ප්‍රතිචාර දක්වමින් විශ්වාසයේ ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 11.2.6**: මීසම තුළ විවිධ ධර්මදූත කටයුතුවල ක්‍රියාශීලී ව නිරත වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- ජේසුස් වහන්සේගේ දූත මෙහෙවර පිළිබඳ කරුණු ගොනු කරයි.
- ජනතා සේවය සඳහා දිවි කැප කළ යුතු බව පිළිගනියි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- ධර්මදූත කටයුතුවල නිරත වෙයි.
- මීසමේ ධර්මදූත කටයුතුවලට සහයෝගය ලබා දෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- ඇමුණුම 2 ඇසුරෙන් අතිඋතුම් ඔස්කා රොමේරෝ රදගුරුතුමාගේ ජීවිත කථාව පංතියට ඉදිරිපත් කර, පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් කරන්න.
- අති උතුම් ඔස්කා රොමේරෝ රදගුරුතුමා එල් සැල්වඩෝරය නම් රටේ පැවති දූෂණ, අක්‍රමිකතා, භීෂණය හා අසාධාරණකම් ගැන ප්‍රසිද්ධියේ විවේචනය කළ බව
- මේ ශ්‍රේෂ්ඨ ක්‍රියාව නිසා ම ඔහු සතුරෙකුගේ වෙඩි පහරකින් මරණයට පත් වූ බව
- අන් අයගේ විමුක්තිය වෙනුවෙන් ඔහු ජීවිතය පරිත්‍යාග කළ බව
- මෙතුමා ජීවිතය පරිත්‍යාග කළේ තම රටේ ජනතාව වෙනුවෙන් බව
- මුළු මිනිස් සංහතියට ම විමුක්ති උදාකර දීමට ජේසුස් වහන්සේ තම ජීවිතය පූජා කළ බව

(මිනිත්තු 15)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

(මිනිත්තු 30)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - ජේසුස් වහන්සේගේ බෞතීස්මය (ලූක් 3/21-22)
  - ජේසුස් වහන්සේ පරීක්ෂා කරනු ලැබීම (ලූක් 4/1-13)
  - තමන් සතු බලය හා හැකියා අන් අය වෙනුවන් යෙදිය යුතු බව

- ආහාරයෙන් පෝෂණය වන ශාරීරික ජීවිතයට වඩා දේව වචනයෙන් පෝෂණය වන ආධ්‍යාත්මික ජීවිතය උතුම් බව
    - අප ජීවිතයේ දෙවියන් වහන්සේට හිමි තැන, ධනයටවත්, බලකාමයටවත්, කීර්තියටත් නොදිය යුතු බව
- ජේසුස් වහන්සේගේ නාසරෙත්හි දේශනාව (ලූක් 4/16-21)
    - නාසරෙත්හි දේශනාවේ දී ජේසුස් වහන්සේගේ දූත සේවාවේ අරමුණු පැහැදිලි කළ බව
- ප්‍රාතිහාර්ය වර්ගීකරණය
    - ප්‍රාතිහාර්ය දෙවියන් වහන්සේ අනාවරණය වන ඔවුන් වහන්සේගේ බලය විදහාපාන මහත් ක්‍රියා බව
    - ප්‍රාතිහාර්ය ප්‍රධාන වශයෙන් කොටස් හතරකට වෙන් කර හඳුනා ගත හැකි බව
        1. රෝගීන් සුව කිරීම හා සම්බන්ධ ප්‍රාතිහාර්ය
        2. දුෂ්ටාත්ම දුරු කිරීම හා සම්බන්ධ ප්‍රාතිහාර්ය
        3. මළවුන් නැගිටුවීම හා සම්බන්ධ ප්‍රාතිහාර්ය
        4. ස්වභාවය ධර්මය හා සම්බන්ධ ප්‍රාතිහාර්ය
    - ඇදහිල්ලෙන් පිළිතුරු දෙන විට අප ජීවිතවල ප්‍රාතිහාර්ය සිදුවන බව
- 70 දෙනාගේ ධර්මදූත මෙහෙය (ලූක් 10/1-12)
- ජේසුස් වහන්සේ ඔවුන්ට උපදෙස් හා අවවාද අනුශාසනා ලබා දුන් බව
- ක්‍රිස්තුන් වහන්සේ ගෝලයන් වෙත පැවරුණු දූත කාර්යයන් පිළිබඳ වගකීම, අද ශුද්ධ වූ සභාව තුළ, අපට ද පැවරී ඇති බව
- ගිහි අපෝස්තලික සේවාවන් සඳහා ඉදිරිපත් විය යුතු බව
- අභියෝග ඉදිරියේ නොසැලී ජය ලබා ගැනීමට ක්‍රිස්තුන් වහන්සේගේ ආදර්ශ අප අනුගමනය කළ යුතු බව

(මිනිත්තු 35)

**ගුණාත්මක යෙදවුම්**

- ශුද්ධ බයිබලය
- බ්‍රිසිල් බෝඩ් / ඩිමයි, ජ්ලැටිග්නම්
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

ඇමුණුම 1

1 කණ්ඩායම: ලූක් 3/21-22 හා ලූක් 4/1-13 කියවා, බෞතීස්මය ලැබූ ජේසුස් වහන්සේ පරීක්ෂා ජය ගැනීම තුළින් ඔබට ලැබෙන ආදර්ශ නිර්මාණාත්මක ව ඉදිරිපත් කරන්න.

2 කණ්ඩායම : ලූක් 4/16-20 කියවා, ජේසුස් වහන්සේ මෙලොවට පැමිණීමේ අරමුණු ලියා දක්වා දුගීන්ට, පීඩිතයන්ට හා රෝගීන්ට නව ලොවක් උදාකර දීමට ඔබට කළ හැකි කාර්යයන් වගුගත කරන්න.

3 කණ්ඩායම : පෙළපොතේ 10වන පාඩම කියවා ජේසුස් වහන්සේ සිදු කළ සිව් වැදෑරුම් ප්‍රාතිහාර්ය මැයෙන් පෝස්ටරයක් නිර්මාණය කරන්න.

4 කණ්ඩායම : ලූක් 10/1-12 කියවා, ධර්මදූත සේවයේ නිරත ව සිටින්නන් අනුගමනය කළ යුතු ජේසුස් වහන්සේගේ ඔවදන් නිර්මාණාත්මක ව ඉදිරිපත් කරන්න.

## ඇමුණුම 2

## අතිඋතුම් ඔස්කා රොමේරෝ රදගුරුතුමා

එල් සැල්වඩෝරය නම් රටේ ජනතාව, දස වසරක් පුරා පැවති යුද්ධය නිසා දුක් වින්දාහ. 1977 පෙබරවාරි මාසයේ එම රටේ අගරදගුරුතුමා ලෙස අතිගරු ඔස්කා රොමේරෝ රදගුරුතුමා පත් කරන ලදි. මෙතුමා තුළ ගැඹුරු දැඩි අධිෂ්ඨානය, ප්‍රේමය, සාධාරණත්වය වැනි ගුණාංග දිස්විය. එතුමාගේ තදබල අභිලාෂය වූයේ, මිනිසුන්ගේ ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා කැපවීම යි. මෙතුමා රටේ පවත්නා දූෂණ, අක්‍රමිකතා, භීෂණය හා අසාධාරණකම් ගැන ප්‍රසිද්ධියේ විවේචනය කළේ ය. සමාජ අසාධාරණයට එරෙහි ව අරගල කළ ජනතාව උන් වහන්සේ වටා රොක් විය. වර්ෂ 1980 මාර්තු මස 24වන දින රෝහලක පිහිටි කුඩා දෙව්මැදුරක කළ දේශනය අවසානයේ දී ''අපි විශ්වාසයෙන් හා බලාපොරොත්තුවෙන් යුක්ත ව එකට එකතු වෙමු'' යන වචනය කියා අවසන් වෙත් ම සතුරාගේ වෙඩි උණ්ඩය රදගුරුතුමාගේ හදවත පසාරු කරගෙන ගියේ ය.

**ගෙදර පරිසරයෙන්**

මීසමේ ධර්මදූත කටයුතුවලට දරුවන් යොමු කරවන්න.

## 11 වන පාඩම

## දේව රාජ්‍යය

**නිපුණතාව 2.0** : දේව අනාවරණයට ප්‍රතිචාර දක්වමින් විශ්වාසයේ ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 11.2.7**: දේව රාජ්‍යයේ වටිනාකම් තුළින් ජීවිතය ආලෝකවත් කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- දේව රාජ්‍යය පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- ලාංකීය සාරධර්ම ජීවත් කළ යුතු බව පිළිගනියි.
- ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- දේව රාජ්‍යයේ වටිනාකම් ජීවත් කරවයි.
- සියල්ලන් සමග යහපත් මානව සබඳතා ඇති කර ගනියි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- ඇමුණුම 2 ක්‍රියාත්මක කර, පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් කරන්න.
- දේව රාජ්‍යයේ සාමාජිකයන් ලෞකික වටිනාකම් අභිබවා යන ධර්මතාවලින් පොහොසත් විය යුතු බව
- දේව රාජ්‍යයට පටහැනි ක්‍රියාවලින් අප ඈත් විය යුතු බව
- දේව රාජ්‍යයේ වටිනාකම් සමාජය තුළ ජීවත් කළ යුතු බව
- ක්‍රිස්තුන් වහන්සේ දේව රාජ්‍යය ප්‍රකාශ කළ බව

(මිනිත්තු 15)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

(මිනිත්තු 30)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
- දේව රාජ්‍යය යනු
- දේව රාජ්‍යය වටිනාකම් උපමා මගින් විස්තර වන බව (මතෙව් 13)
- කන්ද උඩ දේශනාව මගින් දේව රාජ්‍යයේ වටිනාකම් ගෙනහැර දක්වන බව (මතෙව් 5-7 පරිච්ඡේද) උදා: භාග්‍ය 8 (මතෙව් 5/1-12)
- දේව රාජ්‍යය මිහිමත උදාවූ බව, ජේසුස් වහන්සේ ප්‍රාතිහාර්ය මගින් සනාථ කළ බව(ලූක් 11/20)

- ශ්‍රී ලාංකික සාරධර්ම තුළින් ද දේව රාජ්‍යයේ වටිනාකම් ඉස්මතු වන බව
- සාරධර්ම ජනතාව තුළ රෝපණය කිරීමට භාග්‍ය අට මගින් ජේසුස් වහන්සේ මග පෙන්වූ බව
- සමාජය තුළ සාරධර්ම ප්‍රගුණ කිරීමෙන් දේව රාජ්‍යය වෙත යොමු විය හැකි බව
- ශ්‍රී ලාංකික සමාජය තුළ ඇති සාරධර්ම ජීවත් කරවීමට ක්‍රියා කළ යුතු බව
- ශ්‍රී ලංකාවේ පිරිහෙමින් පවතින සාරධර්ම ආරක්ෂා කිරීමට පියවර ගත යුතු බව
- දේව රාජ්‍යය උරුම කර ගැනීමට අප සියලු දෙනා කැඳවන බව
- දේව රාජ්‍යය අයිති කර ගැනීමෙන් විපුල ඵල ලැබෙන බව

(මිනිත්තු 35)

**ගුණාත්මක යෙදවුම්**

- ශුද්ධ බයිබලය
- බ්‍රිසිල් බෝඩ් / ඩිමයි, ජ්ලැටිග්නම්
- ඇමුණුම 1 හා 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

ඇමුණුම 1

- පෙළ පොතේ 11 වන පාඩම කියවා දේව රාජ්‍යය පිළිබඳ ව නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 2

- ''ජනප්‍රිය වන්න''
- ''සාමය පතුරවන්න''
- ''තත්ත්වය රැක ගන්න''
- ''නිහතමානී වන්න''
- ''දන් දෙන්න''
- ''සාධාරණත්වයට මුල්තැන දෙන්න''
- ''සත්‍යයට සාක්ෂි දරන්න''
- ''නපුර සිතේ ධාරණය කර ගන්න''
- ''දීනපතා යාච්ඤා කරන්න''
- ''සානුකම්පිත වන්න''
- ''තණ්හා ආශාවලින් මිදෙන්න''
- ''නීතිය ඔබේ වාසියට හරවා ගන්න''
- ''සතුරන් මැඩලන්න''
- ''කා බී ජොලි කරන්න''
- ''ඔබේ කීර්ති නාමය ගැන නිතර හිතන්න''
- ''අනුන් විනිශ්චය නොකරන්න''
- ''අයුක්තියට හිස නමන්න''
- ''යුක්ති ගරුක වන්න''
- ''සතුරාට වෛර කරන්න''
- ''ධනය රැස් කරන්න''

- ඉහත දක්වන ලද වගන්ති ඩිමයි කොළයක ලොකුවට ලියා දක්වන්න. එය පන්තියේ සිසුන්ට ප්‍රදර්ශනය කරන්න. එහි ඇති දේව රාජ්‍යයේ වටිනාකම් හා ලෞකික රාජ්‍යයේ වටිනාකම් වෙන වෙන ම සොයා සිසුන් ලවා හුණු පුවරුවේ සටහන් කරවන්න. දේව රාජ්‍යයේ වටිනාකම්වල අගය සිසුන්ට පහදා දෙන්න.

**ගෙදර පරිසරයෙන්**

කිතුනු සාරධර්ම අනුව ජීවත්වීමට දරුවන් හුරු කරවන්න.

## 12 වන පාඩම

## ප්‍රසාද ස්නාපනය හා අභිවෘද්ධි ආලේපය

**නිපුණතාව** **3.0** : දේව ප්‍රසාද නිධාන මගින් ක්‍රිස්තුන් වහන්සේට සම්බන්ධ වී නව ජීවිතයකට සාක්ෂි දරයි.

**නිපුණතා මට්ටම** **11.3.1** : පරිණත කිතුනුවෙකු ලෙස, ආදර්ශවත් ජීවිතයක් ගත කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- ප්‍රසාද ස්නාපනය හා අභිවෘද්ධි ආලේපය පිළිබඳ තොරතුරු ගොනු කරයි
- පරිණත කිතුනුවකු ලෙස ආදර්ශමත් ජීවිතයක් ගත කිරීමට කැමැත්ත පල කරයි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- පරිණත කිතුනුවකු වශයෙන් ජීවත් වෙයි.
- නිසි වයසේ දී දේව ප්‍රසාද නිධාන ලබා ගැනීමට අන් අය ව දිරිමත් කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- ළදරුවෙකු ව ප්‍රසාද ස්නාපනය කරන අන්දම දැක්වෙන පින්තූරය හා අභිවෘද්ධි ආලේපය දානය කරන අන්දම දැක්වෙන පින්තූරය ද ප්‍රදර්ශනය කරමින් පහත අදහස් ද මතු කරමින් සාකච්ඡා කරන්න.
  - ප්‍රසාද ස්නාපනයෙන් ජම්ම පාපයෙනුත්, කර්ම පාපයෙනුත් අප නිදොස් කර දේව දරුකමත් ශුද්ධ වූ සභාවේ සාමාජිකත්වයත් හිමි වන බව
  - වැඩි දියුණුවීම, වර්ධනය වීම, පරිණතභාවයට පත්වීම යනාදී අර්ථ ''අභිවෘද්ධි'' යන වචනයේ අන්තර්ගත වන බව
  - ප්‍රසාද ස්නාපනය මගින් දේව දරුකම ලබන කිතුනුවා අභිවෘද්ධි ආලේපය මගින් ශක්තිමත් වී, පරිණත කිතුනුවකු බවට පත් වන බව

(මිනිත්තු 15)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර, ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල සිසුන් නිරත කරවා, සිසුන්ගේ ක්‍රියාකාරකම් සමීප ව නිරීක්ෂණය කරමින් අවශ්‍ය මගපෙන්වීම් ලබා දෙන්න.

(මිනිත්තු 30)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - ප්‍රසාද ස්නාපනය
    - අවශ්‍යතාව (ජොහන් 3/5)

- ක්‍රිස්තුන් වහන්සේගේ අවසාන ආඥාව (මතෙව් 28/19-20)
- ප්‍රසාද ස්නාපනයෙන් ලැබෙන වරප්‍රසාද
  - දේව දරුවෙකු වීම
  - ශුද්ධ වූ සභාවේ සාමාජිකයෙක් වීම
  - ජම්ම පාපයෙන් නිදොස් වීම
  - සියලු කර්ම පාපවලට සමාව ලැබීම
  - අනෙකුත් ප්‍රසාද නිධාන ලබා ගැනීමට හැකිවීම
  - ශුද්ධාත්මයාණන් වහන්සේ වැඩ වසන දේව මාලිගයක් වීම
- ආත්මික මව්පියන්වීමට අවශ්‍ය සුදුසුකම්
  - ආරම්භක දේව ප්‍රසාද නිධාන ලබා තිබීම
  - වයස අවුරුදු 16 සම්පූර්ණ වී සිටීම
  - ශුද්ධ වූ සභාව විසින් ප්‍රකාශ කරන ලද කිසියම් දඬුවමකට යටත් නොවූවකු වීම.
  - තමන්ගේ විශ්වාසය ජීවත් කරවන හා තමන්ගේ කාර්යභාරය ගැන අවබෝධයක් තිබීම.
- ප්‍රසාද ස්නාපනය දානය කිරීමේ දී භාවිත කරන සලකුණුවල අර්ථ
  (ජලය, සුදු වස්ත්‍රය, ශුද්ධ වූ තෛලය, පාස්කු ඉටිපහන)
- ශාසන නීතිය 851, 857, 862, 865, 867, 868, 872

- අභිවෘද්ධි ආලේපය
  - ගැලවීමේ ඉතිහාසය තුළ අභිවෘද්ධි ආලේපය
  - ලැබීමට අවශ්‍ය සුදුසුකම්
    - ප්‍රසාද ස්නාපනය ලබා තිබීම
    - වයස අවුරුදු 14 සම්පූර්ණ කර තිබීම
    - ඉෂ්ට වරප්‍රසාදය තුළ ජීවත්වීම (සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ලබාගෙන අභිවෘද්ධි ආලේපය ලබා ගැනීමට සූදානම් විය යුතු ය)
    - පූර්ව සූදානම (නිසි ධර්මෝපදේශයක් ලැබිය යුතු ය)
  - පිළිවෙත හා එහි අර්ථය
  - ලැබෙන වරප්‍රසාද (ක.ස.ධ. 1302-1305)
  - ලැබිය හැකි අය (ක.ස.ධ. 1306-1311)
  - දානය කරන්නා (ක.ස.ධ. 1312-1314)

(මිනිත්තු 35)

**ගුණාත්මක යෙදවුම්**

- ශුද්ධ බයිබලය
- ළදරුවෙකුට ප්‍රසාද ස්නාපනය දානය කරන අන්දම දක්වෙන පින්තූරය
- අභිවෘද්ධි ආලේපය දානය කරන අන්දම දක්වෙන පින්තූරය
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

ඇමුණුම 1

- පෙළපොතේ 12වන පාඩම කියවන්න.
- ඔබට ලැබී ඇති මාතෘකාව පිළිබඳ ව නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න.
- 1 කණ්ඩායම : ප්‍රසාද ස්නාපනය
- 2 කණ්ඩායම : අභිවෘද්ධි ආලේපය

**ගෙදර පරිසරයෙන්**

පරිණත කිතුනුවෙකු ලෙස වගකීම් භාර ගැනීමට දරුවන් හුරු කරවන්න.

## 13 වන පාඩම

## සුවය දානය කිරීමේ දේව ප්‍රසාද නිධාන

**නිපුණතාව** 3.0 : දේව ප්‍රසාද නිධාන මගින් ක්‍රිස්තුන් වහන්සේට සම්බන්ධ වී නව ජීවිතයකට සාක්ෂි දරයි.

**නිපුණතා මට්ටම** 11.3.2 : සුවය දානය කිරීමේ දේව ප්‍රසාද නිධානය තුළින් ආත්මික හා ශාරීරික සුවය ලබයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- සුවය දානය කිරීමේ දේව ප්‍රසාද නිධාන දෙක පිළිබඳ ව තොරතුරු ගොනු කරයි.
- අවශ්‍ය අවස්ථාවල දී සුවය දානය කිරීමේ දේව ප්‍රසාද නිධාන ලබා ගත යුතු බව පිළිගනියි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- සැබෑ මනස්තාපයක් තුළින් සිත් හැරීමක් ඇති කර ගනියි.
- රෝගීන් බැහැදැක ඔවුන් වෙනුවෙන් යාච්ඤා කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- සමගි සන්ධානය දේව ප්‍රසාද නිධානය හා රෝගීන් ආලේප කිරීමේ දේව ප්‍රසාද නිධානය දානය කරන අන්දම දැක්වෙන පින්තූර ප්‍රදර්ශනය කරමින් පහත සඳහන් අදහස් ද මතු කරමින් සිසුන් සමග සාකච්ඡා කරන්න.
  - පින්තූර මගින් පෙන්නුම් කරන දේව ප්‍රසාද නිධාන දෙක
  - එම දේව ප්‍රසාද නිධාන දෙක හැඳින්වීමට භාවිත කරන පොදු නම
  - එම දේව ප්‍රසාද නිධාන ලබා ගැනීමට අවශ්‍ය වන අවස්ථා
  - පාපය නිසා දෙවිඳුන් සමගත්, අන් අය හා තමා සමගත් පවතින සම්බන්ධතාව බිඳ වැටෙන බව
  - සමගි සන්ධානය දේව ප්‍රසාද නිධානය තුළින් බිඳ වැටුණු සම්බන්ධය නැවත ගොඩනැගෙන අතර පව් සමාව ද ඇතුළාන්ත සැනසීම ද, නැවත පව් නොකර සිටීමට ශක්තිය ද ලැබෙන බව
  - අපගේ වරදට සමාව ලබා ගැනීම සඳහා අන් අයගේ වරදට සමාව දීම ද අවශ්‍ය බව (මතෙව් 6/9-13, මතෙව් 6/14-15 )
  - වයෝවෘද්ධ අවධියේ දී මෙන් ම අසාධ්‍ය රෝගී තත්ත්වයෙන් පසුවන තැනැත්තන්ට රෝගීන් ආලේප කිරීමේ දේව ප්‍රසාද නිධානය දානය කරන බව
  - රෝගාතුර කාලය තුළ දී කිහිප වතාවක් ම රෝගීන් ආලේප කිරීමේ දේව ප්‍රසාද නිධානය ලබා ගත හැකි බව.

(මිනිත්තු 15)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවා සිසුන්ගේ ක්‍රියාකාරකම් සමීප ව නිරීක්ෂණය කරමින් අවශ්‍ය මගපෙන්වීම් ලබා දෙන්න.

(මිනිත්තු 30)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - සමගි සන්ධානය
    - සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය හඳුන්වන විවිධ නම් (ක.ස.ධ. 1423-1424) පාපෝච්චාරණය, සමගිවීමේ ප්‍රසාද නිධානය නොහොත් සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය, සිත් හැරීමේ දේව ප්‍රසාද නිධානය, පශ්චාත්තාපයේ දේව ප්‍රසාද නිධානය, සමාව දානය කිරීමේ දේව ප්‍රසාද නිධානය
    - ඇතුළාන්ත මනස්තාපය (ක.ස.ධ. 1430-1433)
    - මනස්තාප වන ක්‍රම (ක.ස.ධ. 1434-1439)
    - මනස්තාප වූවන් කළ යුතු දේ (ක.ස.ධ. 1450-1460)
    - ප්‍රතිඵල (ක.ස.ධ. 1468-1470)
  - රෝගීන් ආලේප කිරීමේ දේව ප්‍රසාද නිධානය
    - ක්‍රිස්තුන් වහන්සේ රෝගීන් සුව කිරීම (ක.ස.ධ. 1503-1510)
    - නව ගිවිසුම තුළ (ජාකොබ් 5/14-15)
    - අපෝස්තුලුවරුන් රෝගීන් සුව කිරීම (මාක් 6/15, ක්‍රියා 3/1-10)
    - සක්‍රමේන්තුව පිළිබඳ ශුද්ධ වූ සභාවේ ඉගැන්වීම් (ක.ස.ධ. 1511-1513)
    - පිළිවෙත
    - ලැබෙන වරප්‍රසාද
    - නිවසේ සූදානම
    - රෝගියාගේ සූදානම

(මිනිත්තු 35)

**ගුණාත්මක යෙදවුම්**

- ශුද්ධ බයිබලය
- සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය හා රෝගීන් ආලේප කිරීමේ දේව ප්‍රසාද නිධානය දානය කරන අන්දම දැක්වෙන පින්තූර
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

ඇමුණුම 1

- පෙළපොතේ 13වන පාඩම කියවන්න.
- ඔබට ලැබී ඇති මාතෘකාව පිළිබඳ ව නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න.

  1 කණ්ඩායම : සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය

  2 කණ්ඩායම : රෝගීන් ආලේප කිරීමේ දේව ප්‍රසාද නිධානය

**ගෙදර පරිසරයෙන්**

යහපත් පාපෝච්චාරණයක් කිරීම සඳහා දරුවන් ව යොමු කර වන්න.

## 14 වන පාඩම

## පූජකවරය

**නිපුණතාව** 3.0 : දේව ප්‍රසාද නිධාන මගින් ක්‍රිස්තුන් වහන්සේට සම්බන්ධ වී නව ජිවිතයකට සාක්ෂි දරයි.

**නිපුණතා මට්ටම** 11.3.3 : පූජකවරය අගය කරමින් එම සේවාවෙන් ලැබෙන උපරිම පල නෙලා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- පූජකවරය පිළිබඳ ව තොරතුරු ගොනු කරයි.
- පූජාප්‍රසාදීන් වහන්සේලා වෙනුවෙන් යාච්ඤා කළ යුතු බව පිළිගනියි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- පූජාප්‍රසාදීන් වහන්සේලාගේ සේවාව සාර්ථක කර ගැනීමට ක්‍රියාශීලී ව දායක වෙයි.
- පූජාප්‍රසාදීන් වහන්සේලාට කීකරු ව දිවි ගෙවයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

තම මීසමේ පූජාප්‍රසාදීන් වහන්සේගේ කාර්යයන් හා එතුමා මීසමට කරන සේවාවන් පිළිබඳ තොරතුරු විමසමින් සංවාදයක් ගොඩනගන්න.

(මිනිත්තු 15)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවා සිසුන්ගේ ක්‍රියාකාරකම් සමීප ව නිරීක්ෂණය කරමින් අවශ්‍ය මගපෙන්වීම් ලබා දෙන්න.

(මිනිත්තු 30)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන දෙක පිළිබඳ ව හැඳින්වීම
    (අනෙක් දේව ප්‍රසාද නිධාන හා මෙහි ඇති වෙනසඃ ධර්මදූත මෙහෙවරක් පැවරීම, දේව ජනතාව ගොඩනැගීම)
  - පූජකවරය
  - ධූරයන්
  - පූජක කොටස් 2 කි.
    1. පදවි පූජක 2. පැවිදි පූජක

- පදවි පූජක පොරොන්දු 2

  1. කීකරුකම 2. පූජක බඹසර

- පදවි පූජක රදගුරු යටතේත්, පැවිදි පූජක පැවිදි නිකායේ ශ්‍රේෂ්ඨයන් යටතේත්, සේවය කරයි.
- පූජකවරයේ පූර්ණත්වය රාජගුරු දූරයට හිමිවේ.
- පූජාප්‍රසාදීන් වහන්සේලාගේ වගකීම්
- තේවාචාර්යවරුන්ගේ වගකීම්
- ඒ අය වෙනුවෙන් ගිහියන්ගේ වගකීම්
- දානය කරන්නා
- පූජකවරය ලැබිය හැකි අය (ක.ස.ධ. 1577-1580)
- පූජාප්‍රසාදීන් වහන්සේලා වෙනුවෙන් යාච්ඤා කළ යුතු බව
- පූජාප්‍රසාදීන් වහන්සේලාගේ සේවාව සාර්ථක කර ගැනීමට ක්‍රියාශීලීව දායක විය යුතු බව.

(මිනිත්තු 35)

**ගුණාත්මක යෙදවුම්**

- ශුද්ධ බයිබලය
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

ඇමුණුම 1

පෙළපොතේ 14වන පාඩම කියවා පූජකවරය නමැති දේව ප්‍රසාද නිධානය පිළිබඳ ව නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

දිනපතා පියතුමන්ලා වෙනුවෙන් යාච්ඤා කිරීමට යොමු කරවන්න.

## 15 වන පාඩම

## ආශිර්වාදකාර බන්ධනය

**නිපුණතාව** 3.0 : දේව ප්‍රසාද නිධාන මගින් ක්‍රිස්තුන් වහන්සේට සම්බන්ධ වී නව ජීවිතයකට සාක්ෂි දරයි.

**නිපුණතා මට්ටම** 11.3.4.: කිතුනු පවුලේ සාමූහිකත්වය හා ශුද්ධවන්තභාවය අත්දකියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- ආශිර්වාදකාර බන්ධනය පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- විවාහවීමේ දී කතෝලිකයෙකු තෝරා ගත යුතු බව පිළිගනියි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- කිතුනු පවුලේ ශුද්ධවන්තභාවය අත්දකියි.
- පවුලේ සාමූහිකත්වය සඳහා කටයුතු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- ආශිර්වාදකාර බන්ධනය දානය කිරීමේ පින්තූරයක් පෙන්වා ඒ ගැන අදහස් විමසමින් ආශිර්වාදකාර බන්ධනයේ පොරොන්දු ගැන සාකච්ඡා කිරීම.
- එම පොරොන්දු පවුල තුළ කොපමණදුරට ඉටු වීම හා ඉටු නොවීම පිළිබඳ ව සාකච්ඡා කිරීම.

(මිනිත්තු 15)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවා සිසුන්ගේ ක්‍රියාකාරකම් සමීප ව නිරීක්ෂණය කරමින් අවශ්‍ය මගපෙන්වීම් ලබා දෙන්න.

(මිනිත්තු 30)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - ආශිර්වාදකාර බන්ධනය අවලංගු කළ නොහැකි ගිවිසුමක් වන බව
  - කිතුනු විවාහයේ ලක්ෂණ 2 (ඒකත්වය හා අඛණ්ඩත්වය)
  - කිතුනු විවාහයේ පරමාර්ථ 2
  - කතෝලික විවාහයට ඇති නීත්‍යානුකූල බාධා
  - විවාහයේ බාහිර සලකුණ (විවාහ පොරොන්දු දීම)

- දානය කරන්නා
- දික්කසාදය  හා අවලංගු විවාහ අතර වෙනස
- සක්‍රමේන්තුවක් වීමට ප්‍රසාද ස්නාපනය ලැබූ දෙදෙනෙක් අතර විවාහය සිදු විය යුතු බව හා එය දිව්‍ය පූජාව තුළ සිදු කිරීම
- දෙදෙනා ම කතෝලිකයන් වීමෙන් සිදු වන යහපත
- විවාහ වීමේ දී කතෝලිකයෙකු තෝරා ගත යුතු බව
- කිතුනු පවුලේ ශුද්ධවන්තභාවය අත්දැකීමට කටයුතු කළ යුතු බව
- පවුලේ සාමූහිකත්වය වෙනුවෙන් කටයුතු කළ යුතු බව

(මිනිත්තු 35)

**ගුණාත්මක යෙදවුම්**

- ශුද්ධ බයිබලය
- ආශිර්වාදකාර බන්ධනය දානය කිරීමේ පින්තූරයක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

ඇමුණුම 1

පෙළපොතේ 15වන පාඩම කියවා එහි අඩංගු කරුණු කොතරම්දුරට වර්තමාන සමාජය තුළ ක්‍රියාත්මක වන්නේ දැයි පෙන්නුම් කරමින් විවේචනාත්මක ලිපියක් ලියන්න.

**ගෙදර පරිසරයෙන්**

පවුල තුළ පැවරෙන වගකීම් හා යුතුකම් ඉටුකරලීමට දරුවන්ව යොමු කරවන්න.

## 16 වන පාඩම

## පැවිදි දිවිය

**නිපුණතාව** 3.0 : දේව ප්‍රසාද නිධාන මගින් ක්‍රිස්තුන් වහන්සේට සම්බන්ධ වී නව ජීවිතයකට සාක්ෂි දරයි.

**නිපුණතා මට්ටම** 11.3.5 : පැවිදි දිවිය තුළින් දේව රාජ්‍යය මිහිමත උදා කිරීමට දරන ප්‍රයත්නය අගය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- පැවිදි දිවිය පිළිබඳ ව තොරතුරු ගොනු කරයි.
- තම කැඳවීම පිළිබඳ ව ගැඹුරින් සිතා බැලිය යුතු බව පිළිගනියි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- පැවිදිවරුන්ගේ සේවාව අගය කරයි.
- පැවිදිවරුන්ගේ දූත සේවාවන් සඳහා සහාය වෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- විවිධ පැවිදි නිකායන්ට අයත් පැවිදිවරුන්/වරියන්ගේ පින්තූර කිහිපයක් ප්‍රදර්ශනය කර පහත කරුණු පදනම් කරගෙන සාකච්ඡාවක් කරන්න.
  - ඔවුන් විවිධ පැවිදි නිකායන්වලට අයත් වන බව
  - ඔවුන් අයත් වන පැවිදි නිකායන්
  - නිකායෙන් නිකායට ඇඳුම වෙනස් වන බව
  - දූත සේවාව වෙනස් වන බව
  - ඔබ ප්‍රදේශයේ සිටින පැවිදි නිකායන් හා ඔවුන්ගේ සේවාවන්

(මිනිත්තු 15)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

(මිනිත්තු 30)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - පැවිදි දිවියේ ඓතිහාසික පසුබිම
  - පැවිදි වේදභාර 3
    (කීකරුකම, ව්‍රත ශුද්ධිය, දිළිඳුකම)

- පැවිදි කොටස් 2
    1. පැවිදි පූජක
    2. පූජක නොවන පැවිදි අය
- පූජක නොවන පැවිදි අය කොටස් 2 කි
    1. පැවිදි සොයුරන්
    2. පැවිදි සොයුරියන්
- එක් එක් කොටසට අදාළ උදාහරණ
- ලංකාවේ පැවිදි නිකායන් කිහිපයක්
- එක් එක් නිකායේ දූත සේවාව කෙටියෙන්
- පැවිදි ජීවිතයේ ලක්ෂණ 3
  (සාංඝික ජීවිතය, යාච්ඤාවේ ජීවිතය, සේවයේ ජීවිතය)
  (ජාතීන්ගේ ආලෝකය 46 හා ක.ස.ධ. 914-933)

(මිනිත්තු 35)

**ගුණාත්මක යෙදවුම්**

- ශුද්ධ බයිබලය
- විවිධ පැවිදි නිකායන්ට අයත් පැවිදිවරුන්/වරියන්ගේ පින්තූර
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

පෙළපොතේ 16වන පාඩම කියවා ''පැවිදි දිවිය'' පිළිබඳ ව නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

පැවිදිවරුන්ට ගරු කිරීමට පුරුදු පුහුණු කරවන්න.

## 17 වන පාඩම

## ගිහි ධර්මදූත සේවය

**නිපුණතාව** 3.0 : දේව ප්‍රසාද නිධාන මගින් ක්‍රිස්තුන් වහන්සේ ට සම්බන්ධ වී නව ජීවිතයකට සාක්ෂි දරයි.

**නිපුණතා මට්ටම** 11.3.6 : ක්‍රියාකාරී ධර්මදූතයෙක් ලෙස කටයුතු කිරීමට කැපවෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- ගිහි ධර්මදූත සේවාව පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- ක්‍රියාකාරී ධර්මදූතයෙක් ලෙස කටයුතු කිරීමට කැමත්ත පල කරයි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- මිසම තුළ ක්‍රියාත්මක වන ගිහි අපොස්තලික සමිති සමාගම්වල ක්‍රියාකාරී සාමාජිකයෙක් වෙයි.
- ගිහි ධර්මදූත සේවාවන් තුළින් අන් අයට සේවය කරයි.

**පාඩම සැලසුම් සඳහා උපදෙස්**

**පියවර 1**

- මීසමේ සේවාවන් කරගෙන යාමට සහාය වන ගිහි ධර්මදූත සමිති සමාගම් පිළිබඳ ව විමසා පහත සඳහන් කරුණු ඇසුරෙන් සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - මීසමේ සේවය කරන ගිහි ධර්මදූත සමිති සමාගම්
    - ඒ එක් එක් සමිති සමාගමේ සේවාවන්
    - ළමා, තරුණ හා වැඩිහිටි වශයෙන් එම දූත සේවාවන් වර්ගීකරණය කළ හැකි බව
    - 11 ශ්‍රේණියේ සිසුවෙකු වශයෙන් සාමාජිකත්වය ලබාගත හැකි ගිහි ධර්මදූත සමිති සමාගම්

(මිනිත්තු 15)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

(මිනිත්තු 30)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
    - පොදු පූජකවරය හා නිල පූජකවරය ලැබෙන ආකාර
    - පොදු පූජකවරයේ ත්‍රිවිධ කාර්යයන්
    - එම වගකීම් ක්‍රියාත්මක කිරීමට ශුද්ධ වූ සභාව තුළ ඇති විවිධ ගිහි අපෝස්තලික සමිති සමාගම්

- විවිධ ගිහි අපෝස්තලික සමිති සමාගම්වල අරමුණු හා සේවාවන්
- සිසුන් වශයෙන් සාමාජිකත්වය ලබා ගත හැකි සමිති සමාගම්
- ක්‍රියාකාරී ධර්මදූතයෙක් ලෙස කටයුතු කළ යුතු බව
- මීසම තුළ ක්‍රියාත්මක වන ගිහි අපෝස්තලික සමිති සමාගම්වලට බැඳී ක්‍රියාකාරී සාමාජිකයන් ලෙස අන් අයට සේවය කළ යුතු බව.
  (ජාතීන්ගේ ආලෝකය 37 හා ක.ස.ධ. 897-913)

(මිනිත්තු 35)

**ගුණාත්මක යෙදවුම්**

- ශුද්ධ බයිබලය
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

ඇමුණුම 1

පෙළපොතේ 17වන පාඩම කියවා ගිහි ධර්මදූත සේවය පිළිබඳ ව නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

මීසම තුළ ක්‍රියාත්මක වන සමිති සමාගම්වලට දරුවන් යොමු කරවන්න.

## 18 වන පාඩම

## පරිසරය සුරකීම

**නිපුණතාව** 4.0 : දේව පනත් පිළිපදිමින් ප්‍රේමයේ ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම** 11.4.1 : දේව මැවිල්ල සංරක්ෂණය කරමින් පරිභෝජනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- මැවීමේ පළමු හා දෙවන කථාවලට අනුව පරිසරය සුරැකීම පිළිබඳ ව තොරතුරු ගොනු කරයි.
- පරිසර සංරක්ෂණය කිරීම සියලු දෙනාගේ යුතුකම බව පිළිගනියි.
- පරිසර සංරක්ෂණය කරන ආකාරය නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- දේව මැවිල්ල වර්ධනය කරමින් සුරකියි.
- පාසලේ පරිසරය අලංකාර කිරීමට දායක වෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- ඇමුණුම 2 ප්‍රදර්ශනය කර පහත කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් කරන්න.
  - අපගේ සහෝදර, සහෝදරයින් රැක බලා ගන්නා සේ ම, පරිසරය ද අප රැක බලා ගත යුතු බව
  - පරිසරය දෙවියන් වහන්සේ අපට දී ඇති උතුම් ත්‍යාගයක් බව
  - පොළොව, ජලය, කඳු, අහස, සතුන්, පක්ෂීන්, ගස් කොළන්, පළතුරු, තණබිම් සියල්ල මිනිසාගේ පරිභෝජනය සඳහා බව
  - දේව මැවිල්ල සර්ව සම්පූර්ණ බව
  - දෙවියන් වහන්සේ මැවිල්ලේ නිර්මාතෘවරයාණන් බව
  - මිනිසා විසින් මැවිල්ල ආරක්ෂා කර සුරැකිය යුතු බව

(මිනිත්තු 20)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

(මිනිත්තු 30)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - මැවීමේ පළමු කතාව (උත්පත්ති 1/1-2/4 අ)
    - මැවීම දෙවියන් වහන්සේගේ කාර්යයකි.
    - සැලැස්මකට අනුව අලංකාර ලෙස සාමකාමී ලෙස දෙවියන් වහන්සේ ලෝකය මවා වදාළ බව

- එම නිසා දෙවියන් වහන්සේ මැවූ සියල්ල මනහර බව
- මැවිල්ලේ මනහර බව, මිනිසා සුරැකිය  යුතු බව
- මිනිසා දේව ස්වරූපයට හා සමානකමට මවා වදාළ බව (උත්පත්ති 1/27)
- මනුෂ්‍යයාගේ කාර්ය දේව මැවිල්ල යළි යළි මැවීම බව
- උත්පත්ති 1/ 28හි පාලනය කිරීම (රාදා) යනු මග පෙන්වමින් සංරක්ෂණය කිරීම බව
- මැවිල්ල සංරක්ෂණය කිරීම මිනිසාගේ යුතුකම බව

- මැවීමේ දෙවන කථාව (උත්පත්ති 2/15)
  - මැවීමේ දෙවන කථාවෙන් දෙවියන් වහන්සේ මිනිසාට වගකීම් 2ක් පවරන බව
    1. වගා කිරීම (අබාද් - වැඩ කරමින් නිර්මාණය කිරීම)
    2. රැක බලා ගැනීම (ෂාමාර් - සංරක්ෂණය කිරීම)
  - වැඩ කිරීම දේව ආශිර්වාදයක් බව
  - මැවිල්ල සංරක්ෂණය කරමින් පරිභෝජනය කිරීම මිනිසාගේ යුතුකම බව
  - මැවිල්ල ආරක්ෂා නොකිරීමෙන් බොහෝ ප්‍රතිවිපාක ඇති විය හැකි බව
  - අද බොහෝ විනාශවලට හේතුව දේව සැලැස්මට  පිටු පා කටයුතු කිරීම බව
  - මැවිල්ල අයුතු ලෙස පරිහරණය නොකළ යුතු බව

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම්**

- ශුද්ධ බයිබලය (උත්පත්ති 1/1-2/4 අ, 2/15)
- ඩිමයි / බ්‍රිසිල් බෝඩ්, ප්ලැටිග්නම්
- ඇමුණුම 1 හා 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

උත්පත්ති 1/1-2/4 අ, 2/15 හා පෙළපොත කියවා, ඔබේ කණ්ඩායමට ලැබුණු මාතෘකාව පිළිබඳ ව නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න.

කණ්ඩායම 01 : ''දෙවියන් වහන්සේගේ මැවිල්ල වන පරිසරය සුරකිමු.''

කණ්ඩායම 02 : ''දෙවියන් වහන්සේගේ සැලැස්මට එරෙහි ව ක්‍රියා කිරීම විනාශයට හේතුවකි.''

**ඇමුණුම 2**

ගංගා අපගේ සොහොයුරන් ය. ඒවා අපගේ පිපාසය සංසිඳුවයි. අපගේ ඔරු තැනින් තැන ගෙන යයි. අපගේත් දරුවන්ගේත් කුසගිනි නිවයි. පොළව අපේ ම කොටසකි. අප පොළොවේ ම කොටසකි. සුවඳ වහනය වන පුෂ්ප අපගේ සොහොයුරියන් ය. වනයෙහි දුව පැන නටන මුවන්, අශ්වයින්, රාජාලියන් අප සොහොයුරන් ය. කඳු මුදුන් තණ පිට්ටනිවල ඇති සාරය එකින් එකට සම්බන්ධ එක ම පවුලේ දේවල් ය.

**-සියැටල්-**

**ගෙදර පරිසරයෙන්**

වැඩ කිරීම තුළින් මැවිල්ල වර්ධනය කිරීමට හුරු කරවන්න.

## 19 වන පාඩම

### සාමය

**නිපුණතාව** 4.0 : දේව පනත් පිළිපදිමින් ප්‍රේමයේ ජීවිතයක් ගත කරයි.
**නිපුණතා මට්ටම** 11.4.2: සාමය උදා කිරීම සඳහා ක්‍රියාකාරී සාමාජිකයෙකු වෙයි.
**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- සාමය පිළිබඳ කරුණු ගොනු කරයි.
- සාමයේ අවියක් විය යුතු බව පිළිගනියි.
- ගොනු කර ගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- යුද්ධය ප්‍රතික්ෂේප කරයි.
- සාමය ඇති කරන අය හා සහයෝගයෙන් ක්‍රියා කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර** 1

- යුද්ධය හා ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධ පුවත්පත් සිරස්තලවලින් පෝස්ටරයක් නිර්මාණය කර, එය ප්‍රදර්ශනය කර පහත කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.
    - යුද්ධ හා ප්‍රචණ්ඩ ක්‍රියා ලෝකයේ සෑම තැන ම සිදුවෙන බව
    - යුද්ධයට හේතු
    - යුද්ධය නිසා ජාතීන් අතර, ආගම් අතර, දේශ අතර ගැටුම් ඇති වන බව
    - ආර්ථික වශයෙන් ද, සාරධර්ම ද පරිහානියට පත් කරන බව
    - මනුෂ්‍ය වටිනාකම් පිරිහෙන බව හා සාමය කඩවන බව
    - ඇතුළාන්ත සාමය ගොඩනැගීම මිනිසාගේ වගකීම බව

(මිනිත්තු 20)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

(මිනිත්තු 30)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
    - ''ෂාලෝම්'' යනු ඇතුළාන්ත සාමය
        - ඇතුළාන්ත සාමයට මූලික වන්නේ සත්‍යය, යුක්තිය, ප්‍රේමය හා නිදහස් බව
        - ඇතුළාන්ත සාමය ඇති කිරීමට අන් අයට හා ඔවුන්ගේ අයිතිවාසිකම්වලට ගරු කළ යුතු බව

- සාමය පිළිබඳ කිතුනු ඉගැන්වීම (ක.ස.ධ. 2302-2306)
    - අන් අය සමග කෝප නොවිය යුතු බව හා අන් අයට ගෞරව කළ යුතු බව (මතෙව් 5/22)
    - කෙනෙකු තුළ ඇති පළිගැනීමේ හැඟීම, කෙනෙකු මරා දැමීමට පවා හැකි බව
    - සතුරාට ප්‍රේම කරමින්, හිංසා කරන අය වෙනුවෙන් යාච්ඤා කළ යුතු බව (මතෙව් 5/44-45)
    - කෙනෙකුට හිංසා කිරීමට සිතීම පවා පාපයක් බව
    - මිනිස් ජීවිතය සුරැකීමට හා නඟා සිටුවීමට සාමය අවශ්‍ය බව
    - යුද්ධය නොමැතිවීම පමණක් සාමය නොවන බව
    - යුක්තිය ගොඩනැඟීම, අන් අයගේ අවශ්‍යතාවලට සංවේදී වීම, අන් අයට ගරු කිරීම, සහෝදර දයාවෙන් කටයුතු කිරීම වැදගත් බව
    - සාමය ක්‍රිස්තුන් වහන්සේගේ ත්‍යාගයක් බව
    - සාමය ගොඩනැඟීමට,
        - ප්‍රචණ්ඩ ක්‍රියා ප්‍රතික්ෂේප කළ යුතු බව
        - මිනිස් අයිතිවාසිකම් සුරැකිය යුතු බව
        - මිනිස් ඝාතන නොකළ යුතු බව
- යුද්ධය පිටුදැකීම (ක.ස.ධ. 2307-2317)
    - යුද්ධය හා අවි ආයුධ රැස් කිරීම භයානක බව
    - යුද්ධය සඳහා වියදම් කරන මුදල්වලින් ලෝකයේ දිළිඳුභාවය තුරන් කළ හැකි බව
    - යුද්ධය ප්‍රතික්ෂේප කිරීම හා ඇතුළාන්ත සාමය ගොඩනැඟීම ක්‍රිස්තියානි යුතුකම බව
    - අවි ආයුධ නිපදවීම හා යුද්ධය පිටුදැකීමට විවිධ සංවිධාන කටයුතු කළ යුතු බව
    - අසීසියේ ප්‍රැන්සිස් මුනිතුමාගේ යාච්ඤාව
    - අප ද සාමයේ අවියක් විය යුතු බව

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම්**

- ශුද්ධ බයිබලය
- ඩිමයි / බ්‍රිසිල් බෝඩ්, ප්ලැටිග්නම්
- ප්‍රචණ්ඩ ක්‍රියා හා යුද්ධ පිළිබඳ පුවත්පත් සිරස්තල
- ඇමුණුම 1 හා 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

පෙළපොතේ 19වන පාඩම කියවා ''යුද්ධය හා සාමය පිළිබඳ ශුද්ධ වූ සභාවේ ඉගැන්වීම්'' පිළිබඳ ව නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න.

## ඇමුණුම 2

### අසීසියේ ශුද්ධ වූ ෆ්‍රැන්සිස් මුනිතුමාගේ යැදුම

ස්වාමීනි මා ඔබගේ සාමයේ අවියක් කළ මැනව.
වෛරයෙන් පිරුණු තැනට ප්‍රේමය ද, අසමගියේ තුවාලයන්ට ශාන්තිය ද, අවිශ්වාසයෙන් යුත් තැනට විශ්වාසය ද, බලාපොරොත්තු සුන්වූ තැනට බලාපොරොත්තුව ද, ශෝකය වටලා ගත් තැනට ප්‍රීතිය ද, අඳුරින් වැසී ගිය තැනට ආලෝකය ද ගෙන යාමට මට වරම් දුන මැනව.

සැනසීම ලැබීමට වඩා සැනසීම දීමට ද, තේරුම් ගනු ලැබීමට වඩා තේරුම් ගැනීමට ද, ප්‍රේමය ලැබීමට වඩා ප්‍රේම කිරීමට ද මා යොමු කළ මැනව. මක්නිසාද යත්, දීමෙන් අපට ලැබීමත්, සමාව දීමෙන් සමාවත්, මරණයෙන් අපට සදා ජීවිතයත් අත්වන නිසා ය.

**ගෙදර පරිසරයෙන්**

සාමයේ අවියක් වීමට දරුවන්ට මග පෙන්වන්න.

## 20 වන පාඩම

## ආත්මික හා ශාරීරික පුණ්‍ය ක්‍රියා

**නිපුණතාව 4.0** : දේව පනත් පිළිපදිමින් ප්‍රේමයේ ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 11.4.3**: කිතුනු ප්‍රේමය ආත්මික හා ශාරීරික පුණ්‍ය ක්‍රියා තුළින් ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- පුණ්‍ය ක්‍රියා පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- ස්වර්ගීය සම්පත ලබා ගැනීමට පුණ්‍ය ක්‍රියා කළ යුතු බව පිළිගනියි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- කුසගින්නේ පෙළෙන්නන් හට ආහාර ලබා දෙයි.
- රෝගීන් ව බැහැදකියි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- පෙර පුහුණුවකින් පසු ව ඇමුණුම 2 සිසුන් දෙදෙනෙක් ලවා පන්තිය ඉදිරියෙහි ක්‍රියාත්මක කරවන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
  - මරණයෙන් පසු සදාකාලික ජීවිතයක් ඇති බව
  - සදාකාලික ජීවිතය ලබා ගැනීමට අප කළ යුතු දේවල්
  - පුණ්‍ය ක්‍රියා ඒ සඳහා අත්‍යවශ්‍ය බව

(මිනිත්තු 20)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

(මිනිත්තු 30)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - ආත්මික පුණ්‍ය ක්‍රියා 7 (මහෝපදේශය 300)
  - ශාරීරික පුණ්‍ය ක්‍රියා 7 (මහෝපදේශය 301), (මතෙව් 25/31-44, තෝබිත් 1/17)
  - එක් එක් පුණ්‍ය ක්‍රියාව පිළිබඳ ව කෙටි විස්තරයක්
  - ආත්මික හා ශාරීරික පුණ්‍ය ක්‍රියාවල අප නිරත විය යුතු බව

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම්**

- ශුද්ධ බයිබලය
- ඩිමයි / බ්‍රිසිල් බෝඩ්, ප්ලැටිග්නම්
- පුවත්පත් සිරස්තල
- ඇමුණුම 1 හා 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

පෙළපොතේ 20වන පාඩම කියවා ඔබට ලැබී ඇති මාතෘකාව පිළිබඳ ව නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න.

කණ්ඩායම 01 ඃ ආත්මික පුණ්‍ය ක්‍රියා

කණ්ඩායම 02 ඃ ශාරීරික පුණ්‍ය ක්‍රියා

**ඇමුණුම 2**

සිසුවා - ටීචර්, ලොකු වුනා ම මම කැමතියි ඉංජිනේරුවෙක් වෙන්න. මොනව ද එයට අවශ්‍ය සුදුසුකම්?

ටීචර් - සාමාන්‍ය පෙළ විභාගේ හොඳට පාස්වෙලා උසස් පෙළට ගණිත විෂය හදාරන්න ඕනේ.

සිසුවා - ඒ ඇත් ද?

ටීචර් - නෑ නෑ. උසස් පෙළ ගණිත විෂය ධාරාවෙන් ඉහළ ප්‍රතිඵල ලබාගෙන විශ්ව විද්‍යාලයට ඇතුළු වෙන්න ඕනේ. ඊට පස්සෙ විශ්ව විද්‍යාලයේ ඉගෙන ගෙන තමයි. ඉංනේරුවෙක් වෙන්න පුළුවන්. මොන අංශය තෝර ගත්තත් ඒ සඳහා අවශ්‍ය සුදුසුකම් තියෙනවා. ඒ විතරක් නොවෙයි, සදාකාලික ජීවිතය ලබා ගන්නත් සුදුසුකම් තියෙනවා. ඒ සුදුසුකම් ගැන ඔබ දන්නවා ද?

සිසුවා - ටීචර් මොනව ද ඒ සුදුසුකම්?

**ගෙදර පරිසරයෙන්**

ආගන්තුකයින්ට සත්කාර කිරීමට යොමු වන්න.

## 21 වන පාඩම

## ශුද්ධ වූ සභාවේ ශික්ෂාපද

**නිපුණතාව** **4.0** : දේව පනත් පිළිපදිමින් ප්‍රේමයේ ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම** **11.4.4**: ශුද්ධ වූ සභාවේ ශික්ෂාපද පිළිපදිමින් බැතිමත් කතෝලිකයෙකු ලෙස දිවි ගෙවයි

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- ශුද්ධ වූ සභාවේ ශික්ෂාපද පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- ශුද්ධ වූ සභාවේ ශික්ෂාපද ආරක්ෂා කිරීමෙන් බැතිමත් කතෝලිකයෙකු විය හැකි බව පිළිගනියි.
- ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- නියමිත දිනවල දී ගොඩමස් කෑමෙන් වළකී සිටියි.
- ශුද්ධ වූ සභාවේ නඩත්තුව සඳහා දායක වෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- ක්‍රිකට් ක්‍රීඩාවේ නීතිරීති පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- නීතිරීතිවල අවශ්‍යතාව හා වැදගත්කම
- අපගේ ක්‍රිස්තියානි ජීවිතය සාර්ථක කර ගැනීමට දේව පනත් හා ශුද්ධ වූ සභාවේ ශික්ෂාපද (පනත්) ඇති බව
- ශුද්ධ වූ සභාවේ ශික්ෂාපද 5ක් ඇති බව

(මිනිත්තු 20)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

(මිනිත්තු 30)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
    - ශික්ෂාපද 5
    - එක් එක් ශික්ෂාපදය පිළිබඳ ව විස්තරයක්
    - දේව දරුවන් ලෙස ජීවත්වීමට දේව පණත් හා ශික්ෂාපද අවශ්‍ය බව

**ගුණාත්මක යෙදවුම්**

- බ්‍රිසිල් බෝඩ් / ඩිමයි, ප්ලැටිග්නම්
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

ඇමුණුම 1

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

පෙළපොතේ 21 පාඩම කියවා, ''ශුද්ධ වූ සභාවේ ශික්ෂාපද'' පිළිබඳ ව නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

පවුලක් ලෙස ඉරුදින සම්පූර්ණ දිව්‍ය පූජාවට සහභාගි වන්න.

## 22 වන පාඩම

## ස්වාමිවාක් ආරාධනාව

**නිපුණතාව** 5.0 : දේව පනත් පිළිපදිමින් ප්‍රේමයේ ජීවිතයක් ගත කරයි.
**නිපුණතා මට්ටම** 11.5.1 : ස්වාමිවාක් ආරාධනාවේ ඉල්ලීම් යථාර්ථයක් කිරීමට කටයුතු කරයි.
**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- ස්වාමිවාක් ආරාධනාව පිළිබඳ ව තොරතුරු ගොනු කරයි.
- ස්වාමිවාක් ආරාධනාව උච්චාරණයේ දී නිවැරදි ඉරියව් භාවිත කළ යුතු බව පිළිගනියි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- ස්වාමිවාක් ආරාධානාවේ ඉල්ලීම් යථාර්තයක් කර ගනියි.
- අන් අයට සමාව දෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- ස්වාමිවාක් ආරාධනාව පන්ති කාමරයේ සියලු දෙනා හා එක් ව නිවැරදි ඉරියව්වෙන් උච්චාරණය කර පහත කරුණු ඉස්මතු වන පරිදි සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ජේසුස් වහන්සේ විසින් ම ඉගැන්වූ යාච්ඤාවක් බව
- ස්වාමිවාක් ආරාධනාවේ ව්‍යූහය
  - ප්‍රශංසාව
  - වන්දනාව
  - ඉල්ලීම
  - කමාව අයැදීම
  - දේව ආරක්ෂාවට නතු වීම

(මිනිත්තු 15)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

(මිනිත්තු 30)

පියවර 3

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
    - මතෙව් 6/9-13 හා ලූක් 11/2-4හි ස්වාමිවාක් ආරාධනාව සඳහන් ව ඇති බව
    - එහි කොටස් 2ක් ඇති බව
        1. ප්‍රශංසාත්මක පැතුම් තුන
        2. ශාරීරික ආධ්‍යාත්මික ඉල්ලීම් හතර
    - එක් එක් පැතුම හා ඉල්ලීම් පිළිබඳ ව කෙටි විස්තරයක්
    - ස්වාමිවාක් ආරාධනාවේ ව්‍යුහය
    - ස්වාමිවාක් ආරාධනාව අප අර්ථාන්විත ව උච්චාරණය කළ යුතු බව
    - අපගේ ජීවිතයේ ආධ්‍යාත්මික හා ශාරීරික අවශ්‍යතාවන් හමුවේ දෙවි පියාණන්ගේ මැදිහත්කම ප්‍රාර්ථනා කළ යුතු බව

(මිනිත්තු 35)

**ගුණාත්මක යෙදවුම්**

- ඇමුණුම 1
- බ්‍රිසිල් බෝඩ්
- ප්ලැටිග්නම්
- A4 වර්ණ කොළ

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

ඇමුණුම 1

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

පෙළපොතේ 22වන පාඩම කියවා, ස්වාමිවාක් ආරාධනාව පිළිබඳ ව නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

අයහපතින් මිදී ජීවත්වීමට දරුවන්ට උදව් වන්න.

## 23 වන පාඩම

## මරිය බැතිය

**නිපුණතාව** 5.0 : යාච්ඤාවෙන් පෝෂණය ලබා දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමග ගැඹුරු සම්බන්ධතාවක් ගොඩනගා ගනියි.

**නිපුණතා මට්ටම 11.5.2** : දේවමාතාවන් කෙරෙහි මහත් වූ භක්ති ආදරයක් ඇති කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- මරිය බැතිය පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- අප වෙනුවෙන් මරියෝත්තමාවන් මැදිහත් වන බව පිළිගනියි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- මරිය තුමිය හා සම්බන්ධ භක්ති අභ්‍යාසවලට භක්තියෙන් සහභාගි වෙයි.
- මීසම තුළ මරිය බැතිය නැංවීමට කරනා ක්‍රියාකාරකම්වලට දායක වෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- පහත කරුණු තීරු පටි කිහිපයක ලියා ෆැනල් හෝ කට්ට පුවරුවක ප්‍රදර්ශනය කරන්න.

 ජපමාල උච්චාරණය
 මරිය වසර
 සදාසරණ නුවානය
 මඩු දේවස්ථානය
 නිර්දෝෂ පිළිසිඳ ගැනීමේ මංගල්‍යය
 මා මච්නි ගීතිකාව

මේ සියල්ල සිසුන්ට හඬ නගා කියවීමට අවස්ථාව ලබා දී පහත කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

- මේ සියල්ල මරිය තුමී හා සම්බන්ධ වන බව
- කතෝලික ජනවන්දනාවේ දී මරිය තුමියට විශේෂ ස්ථානයක් හිමි වන බව
- ජේසුස් වහන්සේගේ මව වෙමින් හා උන් වහන්සේ අනුගාමී වෙමින් ශුද්ධ වූ සභාවේ අභිවෘද්ධිය වෙනුවෙන් එතුමිය කළ සේවය අප නිරතුරු අගය කිරීම නිසා මරිය තුමියට ජනවන්දනාවේ දී විශේෂ තැනක් හිමි වන බව
- මරිය තුමිය වෙනුවෙන් පවත්වන භක්ති අභ්‍යාස මරිය බැතිය ලෙස හැඳින්වෙන බව

(මිනිත්තු 10)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. (මිනිත්තු 30)

පියවර 3

- මරිය බැතියේ දේවධාර්මික පසුබිම
- ජම්ම දෝෂයෙන් නිර්දෝෂව පිළිසිඳ ගැනීම
- මරිය තුමියගේ ස්වර්ගාරෝපණය (ක.ස.ධ. 966)
- මරිය තුමියගේ දර්ශනය වීම්
  - ලූර්දු නුවර
  - පාතිමා නුවර
  - වේලකන්නි
- සදාසරණ නුවානයේ හා දිනපතා පවුල් ජපමාලයේ වැදගත්කම
- මරිය තුමියට ගෞරවය පුද කිරීම සඳහා ශුද්ධ වූ සභාව ගන්නා තීරණවලට අවනත ව ක්‍රියා කිරීම වැදගත් බව

  *නිදසුන්:* ජනවන්දනා වර්ෂයේ දී මරිය තුමිය වෙනුවෙන් පැවැත්වීමට නියමිත මංගල්‍ය හා භක්ති අභ්‍යාස සඳහා යොමුවීම
- මරිය තුමී ශුද්ධ වූ සභාවේ මාතාවන් බව

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම්**

- බ්‍රිසිල් බෝඩ්
- A4 වර්ණ කොළ
- ප්ලැටිග්නම්
- ඇමුණුම 01

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

පෙළපොතේ 23වන පාඩම කියවා, ඔබට ලැබී ඇති මාතෘකා පිළිබඳ ව නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න.

කණ්ඩායම 01 ඃ මරිය බැතියේ දේව ධාර්මික පසුබිම
කණ්ඩායම 02 ඃ ලූර්දු නුවර, පාතිමා නුවර හා වේලකන්නිහි මරිය තුමියගේ දර්ශනය වීම්
කණ්ඩායම 03 ඃ ජම්ම දෝෂයෙන් නිර්දෝෂව පිළිසිඳ ගැනීම හා මරිය තුමියගේ ස්වර්ගාරෝපණය

**ගෙදර පරිසරයෙන්**

මරිය තුමියට ගෞරවය පිණිස කරනා භක්ති අභ්‍යාසවලට දරුවන් යොමු කරවන්න.

## 24 වන පාඩම

## යාම යැදුම්

**නිපුණතාව** 5.0 : යාච්ඤාවෙන් පෝෂණය ලබා දෙවියන් වහන්සේ හා මනුෂ්‍යා සමග ගැඹුරු සම්බන්ධතාවක් ගොඩනගා ගනියි.

**නිපුණතා මට්ටම** 11.5.3 : සන්ධ්‍යා මෙහෙයන් සඳහා සහභාගි වී දෙවියන් වහන්සේට ප්‍රශංසා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- යාම යැදුම පිළිබඳ  තොරතුරු ගොනු කරයි.
- හැකි සෑමවිට ම දේව ප්‍රශංසාවට යොමු විය යුතු බව පිළිගනියි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- දේවස්ථානවල සන්ධ්‍යා මෙහෙයන් සඳහා භක්තියෙන් සහභාගි වී දෙවිඳුන්ට ප්‍රශංසා කරයි.
- මීසමේ සන්ධ්‍යා මෙහෙය සංවිධාන කටයුතුවල දී සහයෝගය දක්වයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පියවර** 1

- සන්ධ්‍යා මෙහෙයක ආකෘතිය පිළිබඳ බුද්ධි කලම්බනයක් කරමින් පහත කරුණු ඉස්මතු කරගන්න.
    - දේවස්ථානයේ මංගල්‍යයට පෙර දින සන්ධ්‍යා මෙහෙය පැවැත්වේ.
        - සන්ධ්‍යා මෙහෙයේ ආකෘතිය
            - ගීතිකා තුනක් මෙනෙහි කිරීම
            - දේව වචනය ප්‍රකාශ කිරීම
            - දේශනාව
            - මරිමව් උදාන ගීය
            - විශ්වාසකයින්ගේ යැදුම්
            - ස්වාමිවාක් ආරාධනාව
            - යාච්ඤාව
            - දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය
    - සන්ධ්‍යා මෙහෙයේ දී දක්නට ලැබෙන මෙම ආකෘතිය යාම යැදුම මත පදනම් වී ඇත.
    - දිනපතා උදේ, මධ්‍යහන, සවස, රාත්‍රී යන යාමයන් මුල් කරගෙන පූජක හා පැවිදි පිරිස් යාම යැදුම උච්චාරණය කිරීම  අනිවාර්ය අංගයක් බව
    - ගිහි ජනතාව ද සන්ධ්‍යා මෙහෙය තුළ දී යාම යැදුමට සම්බන්ධ වන බව.

(මිනිත්තු 10)

පියවර 2

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

(මිනිත්තු 30)

පියවර 3

- එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
- ජනවන්දනාවේ ප්‍රධාන අංග 03
  1. දිව්‍ය පූජාව
  2. දේව ප්‍රසාද නිධාන
  3. යාම යැදුම්
- යාම යැදුම යනු
- යාම යැදුමේ ආරම්භය හා විකාශනය
  - ජුදා ආගමික සම්ප්‍රදාය තුළ ආරම්භ වූ ඉපැරණි සාම්ප්‍රදායික බයිබලීය යැදුම් මෙහෙයකි.
  - ජුදා යාම යැදුම ගායනා ශෛලයෙන් සිදු කළ බව
  - අපෝස්තලික යුගයේ දී ශුද්ධ වූ සභාවේ සියලු ම දෙනා නිශ්චිත වේලාවක දී මෙය සිදු කළ බව.
  - පසුකාලීන ව පූජක හා පැවිදි අයට පමණක් සීමා වූ බව
  - වර්තමානයේ දි සන්ධ්‍යා මෙහෙයන්හි දී ගිහි ජනතාව මීට සහභාගි වන බව
  - පෞද්ගලිකව ද ඇතැම් ගිහි ජනතාව මෙය සිදු කරන බව
- උදේ සහ සවස යාම යැදුමේ ආකෘතිය
  - යාම යැදුමට පිවිසුම
  - ගීතිකාව
  - පළමුවන ගීය
  - දෙවන ගීය
  - තෙවන ගීය
  - දේව වචනය
  - දේව වචනයට ප්‍රතිචාර
  - ප්‍රශංසා ගීත (සෙකරියස්ගේ ප්‍රශංසා ගීය උදෑසන ද මරියතුමීගේ උදාන ගීය සවස ද භාවිත වේ)
  - විශ්වාසකයින්ගේ යැදුම්
  - ස්වාමිවාක් ආරාධනාව
  - අවසන් යැදුම
  - මරිය තුමියගේ උදාන ගීය, සෙකරියස් තුමාගේ ප්‍රශංසා ගීතය, සිමියොන් තුමාගේ ප්‍රශංසා ගීතය
  - යාම යැදුම හා දේවස්ථානවල සන්ධ්‍යා මෙහෙය
  - යාම යැදුම හා පූජක පැවිදි දිවිය

- දවස ශුද්ධවත් කිරීමට, දේව ප්‍රශංසාවට හැකි අවස්ථාවන්හි අප යොමුවිය යුතු බව
- සන්ධ්‍යා මෙහෙයේ ගීතිකා හා යාච්ඤාවලට අර්ථාන්විත ව සහභාගි විය යුතු බව

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම්**

- බ්‍රිස්ටල් බෝඩ්
- A4 කඩදාසි
- ප්ලැටිග්නම්
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

ඇමුණුම 1

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

පෙළපොතේ 24 පාඩම කියවා පහත සඳහන් ඉදිරිපත් කිරීම් සඳහා සූදානම් වන්න.

1. කණ්ඩායම
   යාම යැදුමේ ආරම්භය හා විකාශනය නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීමට
2. කණ්ඩායම
   උදෑසන හා සවස යාම යැදුමේ ආකෘතිය පෝස්ටරයකින් ඉදිරිපත් කිරීමට
3. කණ්ඩායම
   මරියාවන්ගේ උදාන ගීයෙන්, සෙකරියස් තුමාගේ ප්‍රශංසා ගීයෙන් හා සිමියොන් තුමාගේ ප්‍රශංසා ගීයෙන් කියැවෙන අදහස් නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීමට

**ගෙදර පරිසරයෙන්**

දිනපතා යාච්ඤාවේ දී තෙහෙලි ගී භාවිත කිරීමට යොමුවන්න.

## 25 වන පාඩම

## භාවනාව

**නිපුණතාව** 5.0 : යාච්ඤාවෙන් පෝෂණය ලබා දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමග ගැඹුරු සම්බන්ධතාවක් ගොඩනගා ගනියි.

**නිපුණතා මට්ටම 11.5.4**: දේව වචනය පදනම් කරගෙන දිනපතා භාවනා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- භාවනාවේ ඉතිහාසය පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- භාවනාව තුළින් ආධ්‍යාත්මික ජීවිතය පෝෂණය කර ගත හැකි බව පිළිගනියි
- පංති කාමරය තුළ භාවනාත්මක වැඩසටහනක් ක්‍රියාත්මක කරයි.
- දිනපතා පහසු අවස්ථාවක දේව වචනය මෙනෙහි කරමින් භාවනා කරයි.
- භාවනාවෙන් පෝෂණය වී අන් අය හා ඉවසීමෙන් කටයුතු කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

**පියවර 1**

- සිසුන් සියලු දෙනා ම භාවනාව සඳහා සුදුසු ස්ථානයකට රැගෙන යන්න.
  - එම ස්ථානයේ මේසයක් තබා එය මතට සුදු රෙද්දක් දමන්න.
  - මේසය මත ශුද්ධ වූ බයිබලය පෙරළා සිංහාසනාරූඪ කරන්න. (දේව වාක්‍යාසනයේ තබන ආකාරයට)
  - ශුද්ධ බයිබලය ඉදිරියෙන් පොල්තෙල් පහනක් තබා එය දල්වන්න.
  - සිසුන් ව පහසු ඉරියව්වකින් අසුන් ගැනීමට සලස්වන්න.
  - '' පෙම් කරන්න එකිනෙකාට සුහද සොයුරු ප්‍රේමයෙන්'' ගීතිකාව ගායනා කරන්න.
  - ගීතිකාව අවසානයේ ගුරුවරයා විසින් ලූක් 10:30-37 පාඨය කියවා සුළු මොහොතක් නිහඬව සිට, ශුද්ධ බයිබලය ඉහළට ඔසවා, ''දේව වාක්‍ය එසේ ය'' යනුවෙන් පවසා සිඹ, අදාළ ස්ථානයේ තැන්පත් කරන්න.
  - සිසුන් සියලු දෙනා ව ම පහත පියවර ඔස්සේ කෙටි භාවනාවකට යොමු කරවන්න.
  - අපි සියලු දෙනා ම දෑස් වසා ගනිමු.
  - අපට ඈතින් ඇසෙන ශබ්දවලට සවන් දෙමු.
  - අපට ඉතා ළඟින් ම ඇසෙන ශබ්දවලට සවන් දෙමු.
  - දැන් අප ආශ්වාස ප්‍රාශ්වාස කරන ආකාරය වෙත අවධානය යොමු කරමු.
  - අප හුස්ම ඉහළට ගන්නා විට යහපත් ගුණාංග අප තුළට ඇතුළත් කර ගනිමු.
  - අප හුස්ම පහළට හෙලන විට අප සතු අයහපත් ගුණාංග අප තුළින් බැහැර කරමු. (කිහිප වරක් මෙසේ කරන්න)

- ශ්‍රවනය සඳහා ඉදිරිපත් කළ ශුද්ධ ලියවිලි පාඨය සමගින් කෙටි මෙනෙහි කිරීමකට යොමුවන්න.
- දේව ස්වරූපයට අනුව ''ඔබ'', ''ඔබ ව'' දකින්නේ කෙසේ ද?
- ඔබ අන් අයගේ දුක, සතුට හඳුනාගෙන ඒවාට සංවේදී වන අයෙක් ද?
- සංවේදී වන්නේ නම් ඒ ගැන සතුටු වන්න. සංවේදී හදවතක් දුන්නාට දෙවිඳුන්ට තුති පුදන්න.
- එසේ නොමැති නම් අන් අයගේ දුක, වේදනාව, සතුට හඳුනන සිතක් ඔබ තුළ ඇති කර ගන්නට දෙවිඳුන්ගෙන් අයැද සිටින්න.
- දෙවි පියාණන් වහන්සේ අපට ඇති ආදරය නිසා ම දේව ස්වරූපය අනුව අප ව මවනු ලැබුවා. අන් අයගේ දුක, වේදනාව, තනිකම, සතුට, සිනහව හඳුනන උතුම් හදවතක් ද අපට දුන්නා.
- එහෙත් අවසනාවකට මෙන් අප බොහෝ විට අපට ආදරය කරන අයට, පමණක් ආදරය කරන්නට ඔවුන්ගේ දුක සතුට පමණක් බෙදා ගන්නට යොමු වෙනවා.

අපට හිතවත් නොවන, අප නොහඳුනන අයට උදව් කරන්න, ප්‍රේම කරන්නට අප බොහෝ විට මැලි වෙනවා. අප ඔවුන්ට ළං වන්නට බයයි. ඔවුන්ගේ විපතක දී උදව් කරන්නට ගොස් වෙනත් කරදරවලට මුහුණ දෙන්නට සිදුවේ යැයි සිතා අසරණභාවයට පත් වූ ඔවුන්ගේ මුහුණ දුටුව ද අහක බලාගෙන ඒ කිසිවක් නොදුටුවා සේ මා ක්‍රියා කළ අවස්ථා එමටයි. එය මගේ සිතට වේදනා දෙන බවත් මා දන්නවා. එහෙත් මගේ ආත්මාර්ථකාමී හැඟීම් මාව වෙලාගෙන ඒ මොහොතේ එතැණින් පළා යන්නට මාව පොළඹවනවා.

මොහොතක් සිතන්න. මිතුරාට මෙන් ම සතුරාට ද ප්‍රේම කළ ජේසුස් වහන්සේට අනුගාමී වී ජීවත් වන්නට වෙර දරනා කිතුනු දරුවෙකු වන මගෙන් මෙවැන්නක් සිදුවීම කෙතරම් දුරට සුදුසු ද? උන් වහන්සේ ප්‍රේමණීය නෙතකින් මා දෙස බලා සිටිනවා. '' පුතේ ............ හැම දෙනාගේ ම දුක, සතුට ඉදිරියේ සංවේදී වන්න යැ''යි ඒ බැල්ම තුළින් මට ආරාධනා කරනවා.

ආදර මගේ ජේසුනි, මට ආදරය කරන අයට පමණක් නොව මට ආදරය නොකරන අයට ද ප්‍රේම කිරීමේ සිතක් මා හට දුන මැනව. සැබෑ ක්‍රිස්තු අනුගාමිකයෙක් වන්නට මට මග පෙන්වුව මැනව. ආමෙන්,

- අප නැවතත් හුස්ම ඉහළට ගනිමින් යහපත් ගුණාංග අප තුළට ඇතුළත් කර ගනිමු.
- හුස්ම පහළට හෙළමින් අප සතු දුර්ගුණ අපෙන් ඉවත් කරමු.
- අපට ළඟින් ම ඇසෙන ශබ්දවලට සවන් යොමු කරමු.
- අපට ඈතින් ම ඇසෙන ශබ්දවලට සවන් යොමු කරමු.
- දෑන් සෙමින් සෙමින් දෑස් විවර කරන්න.

(මිනිත්තු 40)

**පියවර 2**

පෙර දිනයේ කළ භාවනාව පිළිබඳ විමසීමක් කරන්න.

(විනාඩි 5)

**පියවර 3**

- පහත කරුණු පදනම් කරගෙන පාඩම සංවර්ධනය කරන්න.
    - භාවනාවේ ඉතිහාසය
    - දේව වචනය පදනම් කරගෙන භාවනා කිරීම
    - දිනපතා භාවනා කිරීමේ වැදගත්කම
    - දේව වචනය මෙනෙහි කරමින් භාවනා කිරීම තුළ ආධ්‍යාත්මික දිවිය පෝෂණය කරගත හැකි බව
    - භාවනාව තුළින් ආවේගශීලී සිතුවිලි පාලනය වන බව
    - දිනපතා භාවනාවට යොමුවීම තුළින් මනස හා ශරීරය නිරෝගී ව පවත්වා ගෙන යා හැකි බව

(මිනිත්තු 35)

**ගුණාත්මක යෙදවුම්**

- ශුද්ධ බයිබලය
- මේසයක්
- සුදු මේස රෙද්දක්
- පහනක්
- පෙම් කරන්න එකිනෙකාට ගීතිකාව (සිසුන්ට ප්‍රමාණවත් පරිදි ඡායාපිටපත් කර)
- පැදුරු (ප්‍රමාණවත් පරිදි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**ගෙදර පරිසරයෙන්**

භාවනාව සඳහා දරුවන් යොමු කරවන්න.

**විවිධ සහාය**

| | | |
|---|---|---|
| **කාර්යාලීය කටයුතු** | : | එස්. සී. ප්‍රියදර්ශනී මහත්මිය<br>කළමනාකරණ සහකාර<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| | | ඩයස් අමරසිංහ මහතා<br>කාර්යාල ආධාරක<br>ජාතික අධ්‍යාපන ආයතනය |